# රණවිරුවා

2021 නොවැම්බර් • 236 කලාපය



## විරු දිරියෙන්
## පින් සෙවණක් ඉදිවූ වගයි...

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.



# පින්බිම බැබලවූ සම්බුදු අසිරිය

## “සඳහිරු සෑ රදුන්”

මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් සිය ජීවිත පූජා කළ වීරෝදාර රණවිරුවන් සිහිකිරීම, රණඝිතයට පත් රණවිරුවන්ට ආශිර්වාද එක් කිරීම සහ තිස් වසරක යුද්ධයේ නිමාව සනිටුහන් කිරීම අරමුණු කරගනිමින් යුද, නාවික හා ගුවන් හමුදා වීරෝදාර සෙබළුන් මෙන්ම පොලිස් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ශ්‍රමදායකත්වයෙන් රටේ දෙවන උසින් විශාලතම චෛත්‍යය ලෙස අනුරාධපුරයේ ඉදිකළ "සඳ හිරු" චෛත්‍යය රාජයාණන් වහන්සේ 2021 ඉල් පුර පසළොස්වක පොහෝ දින (නොවැම්බර් මස 18) අතිගරු ජනාධිපතිතුමන්, ගරු අග්‍රාමාත්‍යතුමන් ඇතුළු මැති ඇමැතිවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවති ගෞරවනීය උත්සවයකදී ශ්‍රී සම්බුද්ධ ශාසනයේ සහ මහා සංඝරත්නයේ චිරස්ථිතිය උදෙසා පූජා කරන ලදී.

එම උත්තරීතර අවස්ථාව සඳහා ආරක්ෂක ලේකම් හා එම මැතිනිය, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති, එම මැතිනිය, නාවික හා ගුවන් හමුදාපතිවරු, පොලිස්පති, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, රට වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන්ගේ බිරින්දෑවරුන් හා දරු දැරියන්, රණඝිතයට පත් වීරෝදාර රණවිරුවන් ඇතුළු සැදැහැවත් බෞද්ධ බැතිමතුන් විශාල පිරිසක් එක්ව සිටියහ.

බුබ්බුලාකාර හැඩයකින් යුත් උස අඩි 282 යි අගල් හයක් වන මෙම චෛත්‍යය රාජයාණන් වහන්සේගේ වට ප්‍රමාණය අඩි 801 කි. 2009 මැයි මාසයේදී තිස් වසරක යුද්ධයේ නිමාව සනිටුහන් කරමින් මෙම දැවැන්ත චෛත්‍යයේ ඉදිකිරීම් කටයුතු, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ සංකල්පයකට අනුව වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් එවකට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස කටයුතු කරමින් සිටි කාලසීමාව තුළ දී ආරම්භ විය."සඳහිරු සෑ රදුන්" ඉදිකිරීම සඳහා මුල්ගල තැබූ දින සිට යුද, නාවික, ගුවන් හමුදා මෙන්ම පොලිස් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන්ගේද බැතිමතුන්ගේද නොමසුරු දායකත්වය ඇතිව දිවා රෑ දහදිය වගුරුවමින් එම ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබීය. අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් මත ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ගේ අධීක්ෂණය යටතේ සමස්ත ව්‍යාපෘතිය අතිවිශිෂ්ට ලෙස නිමාකර මෙලෙස බැතිමතුන්ට වන්දනාමාන කිරීම සඳහා දැයට දායාද කරන ලදී.

මෙරට බෞද්ධ උරුම පුනර්ජීවනයේ නව යුගයක් සනිටුහන් කරමින් ඉදිකළ මෙම චෛත්‍යය රාජයාණන් වහන්සේ ශ්‍රී සම්බුද්ධ ශාසනයේ සහ මහා සංඝරත්නයේ චිරස්ථිතිය උදෙසා පූජා කිරීමේ උත්සවයේ සමාරම්භය අතිගරු ජනාධිපතිතුමන්, ජනාධිපති ආර්යාව, ගරු අග්‍රාමාත්‍යතුමන් සහ එම මැතිනියගේ සම්ප්‍රාප්තියෙන් අනතුරුව සනිටුහන් විය.

ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) සහ චිත්‍රානි ගුණරත්න මැතිනිය, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ සුජීවා නෙල්සන් මැතිනිය, නාවික සහ ගුවන් හමුදාධිපතිවරුන්, පොලිස්පති සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ඇතුළු තවත් විශාල පිරිසක් එම පුණ්‍යවන්ත අවස්ථාවට එක්වූහ.











# සඳහිරු සෑ රදුන් අභිමුවදී පළමු "සාංඝික දානය" පූජා කෙරේ











අතිගරු ජනාධිපතිතුමන්ගේ දෙවන පදවි ප්‍රාප්තියට සමගාමීව සංඝගත දක්ෂිණාවක් පිරිනැමීම අභිනවයෙන් ඉදිකළ "සඳහිරු සෑ රදුන්" අභිමුවදී ඉකුත් නොවැම්බර් 19 වන දින සිදුකෙරිණ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම පින්බර කටයුත්තට ජනාධිපති ආර්යා අයෝමා රාජපක්ෂ මැතිනිය, ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමන් මෙන්ම ආරක්ෂක ලේකම් හා එම මැතිනිය, යුද්ධ හමුදාධිපති හා එම මැතිනිය ඇතුළු ආරක්ෂක අංශ නිලධාරීන් මෙන්ම සැදැහැවත් බෞද්ධ පින්වතුන් විශාල පිරිසක් සහභාගී වූහ.



# රුවන්වැලි මහා සෑ රදුන් අභිමුවදී ආශිර්වාද ලැබ









අතිගරු ජනාධිපතිතුමන්ගේ දෙවන පදවි ප්‍රාප්තියට ආශිර්වාද එක්කිරීමේ විශේෂ "ගිලන්පස සහ ආශිර්වාද පූජාව" වැඩමවා වදාළ මහා සංඝරත්නයේ ආශිර්වාද මධ්‍යයේ අනුරාධපුර රුවන්වැලි මහා සෑ රදුන් අභිමුවදී ඉකුත් නොවැම්බර් 19 වන දින සන්ධ්‍යාවේ පැවැත්විණි.




# “ජාතික ආරක්ෂක විද්‍යාලය” දැයට දායාද කෙරේ






ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා රාජ්‍ය අංශයේ ඉහළ තනතුරු දරන විධායක නිලධාරීන්ට ජාතික ආරක්ෂාව හා ක්‍රමෝපායික අධ්‍යයනය සම්බන්ධයෙන් අධ්‍යාපනය ලබාදීමේ අරමුණින් මෙරට ප්‍රථම හා උසස්ම අධ්‍යයන හා පර්යේෂණ ආයතනය වශයෙන් "ජාතික ආරක්ෂක විද්‍යාලය" පසුගියදා ස්ථාපනය කෙරිණ.

ගාලුපාර, කොළඹ 03 පිහිටි ආරක්ෂක අමාත්‍යාංශයට අයත් දිගු ඉතිහාසයක් ඇති "මුම්ටාස් මහල්" ගොඩනැගිල්ලේ ස්ථාපිත මෙම ආයතනය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) සහ ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක, මේජර් ජෙනරාල් අමල් කරුණාසේකර (විශ්‍රාමික) ගේ ආරාධනයෙන් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසින් ඉකුත් නොවැම්බර් 11 වන දින දැයට දායාද කරන ලදී.

මෙම අවස්ථාව සඳහා රාජ්‍ය තාන්ත්‍රිකයින්, ජනාධිපති ලේකම්, ජනාධිපති ප්‍රධාන උපදේශක, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති, නාවික හා ගුවන් හමුදාපතිවරු, පොලිස්පති, ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ නව ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක ඇතුළු සම්භාවනීය පිරිසක් සහභාගී වූහ.

ශ්‍රී ලංකාව තුළ ජාතික ආරක්ෂක විද්‍යාලය ආරම්භ කිරීම ආරක්ෂක අධ්‍යයන වංශකතාවේ නව සන්ධිස්ථානයක් සනිටුහන් කිරීමකි. ආරක්ෂක අංශයේ ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන්ට සහ සිවිල් නිලධාරීන් සඳහා ක්‍රමෝපායික අධ්‍යාපන අවස්ථා ලබාගැනීම සඳහා විදේශ අධ්‍යාපන ආයතනවල පවතින අවස්ථා සෙවීම හැර වෙනත් විකල්පයක් නොතිබූ යුගයක "ප්‍රඥාව - සෞභාග්‍යය - ප්‍රත්‍යස්ථිතිය" යන තේමාව පෙරදැරිව මෙම ජාතික ආරක්ෂක විද්‍යාලය ස්ථාපනය කරන ලදී. මෙම අවස්ථාව සඳහා ඉන්දියාවේ සහ බංගලාදේශයේ මහ කොමසාරිස්වරු, පාකිස්ථානයේ සහකාර මහ කොමසාරිස්, මහජන චීන සමූහාණ්ඩුවේ තානාපති, වෙනත් තානාපති කාර්යාල කිහිපයක ආරක්ෂක උපදේශකවරු සහ විශ්වවිද්‍යාල ආචාර්යවරු පිරිසක් ද සහභාගී වූහ.

# රණවිරු සාදු නාද මැද කූරගල පින්බිමේ කඨින පූජෝත්සවය






කූරගල ලෙන් විහාරය නමින් ප්‍රචලිත බලංගොඩ, කල්තොට ප්‍රදේශයේ පිහිටි ඓතිහාසික කූරගල රජමහා විහාරය ප්‍රතිසංස්කරණය කර "ශාසනයට" පූජා කිරීමෙන් අනතුරුව පැවැත්වෙන ප්‍රථම "කඨින දුස්සය" පූජා කිරීමේ උත්සවය ඉකුත් නොවැම්බර් 07 වන දින පැවැත්විණි. වඩමවා වදාළ මහා සංඝරත්නය 200 නමකගේ සහභාගීත්වයෙන් පැවැති මෙම පූජෝත්සවයට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය, යුද්ධ හමුදා බෞද්ධ බලමණ්ඩලයේ සභාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත්යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඇතුළු සැදැහැවත් බැතිමතුන් රැසක් සහභාගී වූහ.

කූරගල රජමහා විහාරයේ සහ නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ විහාරාධිපති පූජ්‍ය වතුරකුඹුරේ ධම්මරතන හිමිපාණන් විසින් මීට වසරකට පමණ පෙරාතුව යුද්ධ හමුදාධිපතිගෙන් කරන ලද ඉල්ලීමකට අනුව ප්‍රාග් ඓතිහාසික වටිනාකමක් සහිත කූරගල රජමහා විහාරස්ථානය, සමගිය සංහිඳියාව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණ පෙරදැරිව බෞද්ධ සහ අනෙකුත් සියලු ආගමික ප්‍රජාවගේ සහයෝගය ඇතිව යුද්ධ හමුදා හටපිරිස්වල තාක්ෂණික දැනුම හා ශ්‍රමදායකත්වය යොදාගනිමින් ප්‍රතිසංස්කරණය කරන ලදී.




කූරගල රජමහා විහාරයේ "කඨින චීවර" පූජා මහෝත්සවය පැවැත්වීමට ප්‍රථම, "කඨින දුස්සය" අලංකාරවත් පෙරහැරකින් එම විහාරස්ථානය වෙත වැඩම කරවන අතරවාරයේ වන්දනාමාන කිරීම සඳහා ඉකුත් නොවැම්බර් 04 වන දින ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානය වෙත වැඩම කළ අවස්ථාව.

# යාපනයේ ගොවීන් අතර කාබනික පොහොර බෙදාහැරේ







අතිගරු ජනාධිපතිතුමන්ගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට සමගාමීව දියත් කරනු ලබන යුද්ධ හමුදාවේ කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරමින් ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) විසින් නිෂ්පාදනය කළ කාබනික පොහොර ටොන් 50 ක් යාපනය ප්‍රදේශයේ ගොවීන් 30 දෙනෙකු අතර බෙදාදීම ඉකුත් නොවැම්බර් 03 වන දින සිදුකෙරිණ.

යාපනය පලාලි හි පිහිටි යුද්ධ හමුදා ගොවිපළෙහි පැවති එම උත්සවයට ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ආරාධනයකට අනුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය. තවද මෙම අවස්ථාව සඳහා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් කිහිපදෙනෙකු ද එක්වූහ.



යාපනය අර්ධද්වීපයේ කාබනික පොහොර තොගයක් ප්‍රදේශයේ ගොවීන් අතර බෙදාහැරි පළමු අවස්ථාව එය වූ අතර එහිදී තවත් සුවිශේෂත්වයක් එක් කරමින් යුද්ධ හමුදාධිපති විසින් එම ගොවිපළ තුළ කාබනික පොහොර කර්මාන්තශාලාවක් ද විවෘත කරනු ලැබීය.

# පොපි මල් දින අරුත් ගන්වමින්



පළමු ලෝක යුද සමයේ සිට මේ දක්වා යුදබිමේදී දිවිපිදූ සියලුම රණවිරුවන් සිහිකිරීම උදෙසා පවත්වනු ලබන පොපි මල් දින සැමරුම් උත්සවයට සමගාමීව ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ සාමාජිකයින් ඉකුත් නොවැම්බර් 10 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමුවූහ.

එහිදී ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ සභාපති මේජර් ජෙනරාල් උපුල් පෙරේරා (විශ්‍රාමික) විසින් සංකේතාත්මකව යුද්ධ හමුදාධිපති වෙත පොපි මලක් පැළඳවිය. *"In Flanders Field"* නමැති ප්‍රචලිත කවියට අනුව "පොපි" යන වචනය සැමරුම් දින සංකේතයක් ලෙස භාවිතා වූ අතර, ජනප්‍රවාදවලට අනුව පළමු ලෝක යුද සමයේ දී "ෆ්ලෙන්ඩර්ස්" හි පිහිටි යුද පිටිවල මෙම පොපි මල් පිපී පැවති බව සඳහන් වේ. මෙහි ඇති දීප්තිමත් රත් පැහැය යුද්ධයේ දී රුධිරය වැගිරවීම සංකේතවත් කරයි. 77 වැනි ලෝක පොපි මල් සැමරුමට සමගාමීව ශ්‍රී ලංකාවේ පොපි මල් අලෙවියෙන් ලැබෙන ආදායම විශ්‍රාමික සහ ආබාධිත රණවිරුවන්ගේ සුබසාධන කටයුතු සඳහා යොදවනු ලබන අතර පොපිමල් දින සැමරුම් උත්සවය නොවැම්බර් මස 11 දිනට ආසන්නම ඉරිදා දින පවත්වනු ලබයි.

---

# යුද්ධ හමුදා මූලස්ථානයට නව මුළුතැන්ගෙයක්





14 වන ඉංජිනේරු සේවා බලකා කඳවුර ආසන්නයේ ස්ථාපිත කළ යුද්ධ හමුදා මූලස්ථානයේ නව මුළුතැන්ගෙය ඉකුත් නොවැම්බර් 09 වන දින විවෘත කෙරිණි. මූලස්ථාන බලඇණියේ අණදෙන නිලධාරී බ්‍රිගේඩියර් එච්පීඅයි පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ආරාධනාවකට අනුව මෙම අවස්ථාවට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් එක්විය. ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතුවූවන් වෙනුවෙන් ඉදිවූ මෙම මුළුතැන්ගෙය තුළ එකවර 5000 ක භටපිරිසකට ආහාර පිසීමේ හැකියාව පවතී. 14 වන ඉංජිනේරු සේවා බලකායේ තාක්ෂණික දැනුම සහ ශ්‍රමදායකත්වය යොදාගනිමින් ඉදිකරනු ලැබූ මෙම නව මුළුතැන්ගෙය නවීන ශීතකරණ, බොයිලේරු, පොල් ගෑමේ යන්ත්‍ර, ඇඹරුම් යන්ත්‍ර සහ උඳුන් ආදී උපකරණ වලින් සමන්විත වේ.

# නාගරික බාධක තරණ පුහුණු පෙදෙස විවෘත කෙරේ

මාදුරුඔය විශේෂ බලකා පුහුණු පාසල් පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකළ නාගරික බාධක තරණ පුහුණු පෙදෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සුරතින් ඉකුත් නොවැම්බර් 21 වන දින විවෘත කෙරිණ.

මෙම නාගරික බාධක තරණ පුහුණු පෙදෙස, විශේෂ බලකා සෙබළුන්ගේ දරාගැනීමේ හැකියාව, කඩිසරභාවය, ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව හා නම්‍යශීලී බව වැඩිදියුණු කරන අතරම විශේෂ බලකා සෙබළුන්ට නව අභියෝගයන්ට මුහුණදීමට ඇති හැකියාව වර්ධනය කිරීමටද උපකාරී වනු ඇත.





---

# කොරියානු ජනරජයෙන් මාහැඟි පරිත්‍යාගයක්

කොරියානු ජනරජයේ හිටපු ශ්‍රී ලංකා තානාපති, ආචාර්ය ඒ.සාජ්.යූ. මෙන්ඩිස් මහතා විසින් ඉකුත් නොවැම්බර් 05 වන දින රෝහල් වෙත බෙදාදීම සඳහා පිළිකා හඳුනාගැනීමේ යන්ත්‍ර සහ පිළිකා සඳහා ප්‍රතිකාර කිරීමේ උපකරණ තොගයක් පරිත්‍යාග කරන ලදී.



අදාළ උපකරණ යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් වෙත පසුගියදා භාරදෙනු ලැබීය.

කොරියානු ජනරජයේ ජාත්‍යන්තර අන්තර් හුවමාරු සංවර්ධන සංගමය (*International Interchange Development Association*) ශ්‍රී ලංකාවේ ජනතාව වෙත දක්වන ලද ත්‍යාගශීලීත්වය වෙනුවෙන් යුද්ධ හමුදාධිපති එහිදී සිය කෘතඥතාවය පුද කළේය.

# බංගලාදේශයේ 50 වැනි සන්නද්ධ හමුදා දින සැමරුම






බංගලාදේශයේ සන්නද්ධ හමුදාවන්ගේ 50 වැනි සන්නද්ධ හමුදා දින සැමරුම ඉකුත් නොවැම්බර් 21 වන දින කොළඹ ෂැංග්‍රි-ලා හෝටලයේදී පැවැත්විණි. එම අවස්ථාව සඳහා බංගලාදේශයේ සන්නද්ධ හමුදාවන්ගේ ආරාධනයෙන් ආරක්ෂක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති, නාවික හමුදාධිපති සහ ගුවන් හමුදාධිපති ඇතුළු සම්භාවනීය අමුත්තන් මෙන්ම රාජ්‍ය තාන්ත්‍රිකයින්, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි, බංගලාදේශ මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් ඇතුළු විශේෂ ආරාධිතයින් පිරිසක් සහභාගී වූහ.

බංගලාදේශ සන්නද්ධ හමුදා දිනය සෑම වසරකම නොවැම්බර් මස 21 දින උත්කර්ෂවත් අයුරින් සමරනු ලබන අතර, මේ වසරට යෙදී තිබූ 50 වැනි සැමරුම් උත්සවය ශ්‍රී ලංකාවේ බංගලාදේශ මහ කොමසාරිස් අතිගරු තාරෙක් එම්ඩී අරිෆුල් ඉස්ලාම් (*Tareq Md Ariful Islam*) ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

---

# තෙවන එන්නත් මාත්‍රාව ලබාදීම ඇරඹේ





සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශය මත ත්‍රිවිධ හමුදා සාමාජිකයින් විසින් මෙහෙයවනු ලබන ජාතික එන්නත්කරණ වැඩසටහනේ තවත් එක් පියවරක් ඉදිරියට තබමින් කොවිඩ් - 19 වෛරසය දිවයින පුරා ව්‍යාප්තවීම වැළැක්වීමේ කාර්යභාරයේ ඉදිරිපෙළ සාමාජිකයින් ලෙස කටයුතු කරනු ලබන ත්‍රිවිධ හමුදා සාමාජිකයින්, පොලිස් නිලධාරීන්, සෞඛ්‍ය නිලධාරීන් හා සංචාරක ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයින් සඳහා තෙවන මාත්‍රාව ලබාදීම ඉකුත් නොවැම්බර් 01 වන දින නාරාහේන්පිට පිහිටි යුද්ධ හමුදා රෝහලේදී ආරම්භ කරන ලදී. මෙම අවස්ථාවට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ද එක්විය.







# නව නිපැයුම් නිරීක්ෂණයට

යුද හා සිවිල් තාක්ෂණික සංවර්ධනය සඳහා ඉමහත් ප්‍රගතියක් අත්කරදෙමින් නිර්මාණය කරන ලද නව නිපැයුම් 15 ක් ඉකුත් නොවැම්බර් 08 වන දින පනාගොඩ පිහිටි ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පැවති උත්සවයකදී ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී.

මෙම අවස්ථාවට ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් (විශ්‍රාමික) ගේ ආරාධනයකට අනුව ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ නාවික හා ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධානීන් ද සහභාගී වූහ.

එහිදී, ඩ්‍රෝන් ජෑමර් සංවර්ධන ව්‍යාපෘතිය (*Drone Jammer Development Project*), ඉඩම් අත්පත් කරගැනීම හා පැවරීම පිළිබඳ තොරතුරු කළමනාකරණ පද්ධතිය (*Land Acquisition and Vesting Information Management System*), ආහාර ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය (*Food Procurement Management System*), ලේඛන කළමනාකරණ පද්ධතිය (*Document Management System*), අවබෝධතා ගිවිසුම් කළමනාකරණ පද්ධතිය (*MoU Management System*), ඩිජිටල් ජංගම ගුවන් විදුලි යන්ත්‍ර (*Production of Digital Mobile Radio*), විශේෂ මෙහෙයුම් සඳහා ලුහුබැඳීමේ උපාංගය (*Tracking Device for Special Operations*), සංග්‍රාමික වෙඩි තැබීම සඳහා ස්මාර්ට් ඉලක්කපත් පද්ධතිය (*Smart Target System for Jungle Lane Firing*), *BTR* සන්නද්ධ රථ පුහුණු සමාකෘතිය (*BTR Simulator*), මෝටාර් අවි පුහුණු සමාකෘතිය (*Mortar Simulator*), *B*-ඛාණ්ඩයේ වාහන පුහුණු සමාකෘතිය (*B-Vehicle Simulator*) ඇතුළු නව නිපැයුම් රැසක් සංකේතාත්මකව භාරදෙනු ලැබීය.

එසේම, ආබාධිත රණවිරුවන්ට භාවිතා කළ හැකි පරිදි නිෂ්පාදනය කළ අද්විතීය ඉලෙක්ට්‍රොනික කෘත්‍රිම අත් පා, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාවිත කළ හැකි වන අලි පලවා හැරීම සඳහා අතේ ගෙන යා හැකි උපකරණයක් සහ ජාතික ශිෂ්‍යභට බලකාය සඳහා වූ විශේෂ නිලධාරීන්ගේ දත්ත ගබඩාවක් මෙහිදී භාරදෙනු ලැබූ නව නිපැයුම් අතරවිය.











# ව්‍යාපෘති රැසක් අරඹමින් යුද්ධ හමුදාධිපති යාපනයේ සංචාරයක

ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ආරාධනයකට අනුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් නොවැම්බර් 03 වන දින යාපනය අර්ධද්වීපයේ සංචාරයක නිරත විය. එහිදී, උතුරේ ආරක්ෂක තත්වය හා හටපිරිස්වල සුභසාධන කටයුතු පිළිබඳ සොයාබැලූ හෙතෙම ප්‍රදේශයේ ජාතික හා සමාජීය වශයෙන් වැදගත් ව්‍යාපෘති රැසක් ආරම්භ කිරීමටද එක්විය.

සිය සංචාරය අතරතුර පලාලි හි පිහිටි 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ අභිනවයෙන් ඉදිකළ කාර්යාල සංකීර්ණය සහ නිලධාරී නිවස්නය විවෘත කිරීමද යුද්ධ හමුදාධිපතිගේ සුරතින් සිදුවිය. එම කාන්තා බලකාය පසුගියදා නව ස්ථානයක ස්ථානගත කිරීමෙන් අනතුරුව එතෙක් එම ඒකකයට දැඩි අවශ්‍යතාවයක්ව පැවැති මෙම කාර්යාල සංකීර්ණය සහ නිලධාරී නිවස්නය ඉදිකිරීමේ කටයුතු ඇරඹිණ.





# පොල් පැළ සිටුවීමේ ව්‍යාපෘතියක්

දිවයින පුරා පොල් පැළ මිලියන 04 ක් වගා කිරීමේ ජාතික වැඩසටහනට සමගාමීව ආරක්ෂක සේනා මූලස්ථානය - යාපනය යටතේ ස්ථාපිත 51 වන සේනාංක මූලස්ථානය විසින් පලාලි යුද්ධ හමුදා ගොවිපලේ අක්කර 12 ක භූමි ප්‍රමාණයක පොල්පැළ 800 ක් රෝපණය කිරීමේ ව්‍යාපෘතියක් ඉකුත් නොවැම්බර් 03 වන දින දියත් කරන ලදී.

"තුරු මිතුරු නව රටක්" වැඩසටහනට සමගාමීව ක්‍රියාවට නැංවූ මෙම ව්‍යාපෘතියේ සමාරම්භය යාපනය අර්ධද්වීපයේ සංචාරයක නිරත ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ගේ සුරතින් සිදුකෙරිණි. මෙම අවස්ථාවට ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 51 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ඇතුළු පිරිසක් එක්ව සිටියහ. මෙම පොල් පැළ රෝපණය කිරීමේ උත්සවයට තවත් වැදගත්කමක් එක් කරමින් ප්‍රදේශයේ තෝරාගත් සිවිල් වැසියන් 50 දෙනෙකු වෙත වියළි සලාක පාර්සල්, පොල් හා තල් පැළ බෙදාදීමද යුද්ධ හමුදාධිපති විසින් සිදුකරන ලදී.

---

# අලුත්වැඩියා කළ වාහන යළි ධාවනයට




ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ භටපිරිස් විසින් යාපනය ප්‍රදේශයේ අයෝග්‍ය කර තිබූ යුද්ධ හමුදා වාහන 25 ක් අලුත්වැඩියා කර ඉකුත් නොවැම්බර් 03 වන දින යුද්ධ හමුදාවේ ප්‍රයෝජනය සඳහා යොදවනු ලැබූහ. යුද්ධ හමුදා මූලස්ථානයේ උපදෙස් පරිදි පැය 24 පුරාවටම රාජකාරියේ නියුතු භටපිරිස් වෙනුවෙන් වැඩි පහසුකම් සැලසීමත්, රාජ්‍ය භාණ්ඩාගාරයේ අමතර වියදම් අවම කිරීමත් එහි අරමුණයි. මෙලෙස ප්‍රතිසංස්කරණය කරන ලද වාහන යාපනය අර්ධද්වීපයේ ස්ථාපිත සේනාංක, බලසේනා සහ ඒකක වෙත බෙදාදුන් අතර, එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය. එහිදී, බෙදාදුන් වාහන අතර, බස් රථ 10 ක්, ට්‍රක් රථ 05 ක්, යුනි බෆල් රථ 03 ක්, යතුරු පැදි 05 ක්, ට්‍රැක්ටර් රථයක් සහ කැබ් රථයක් විය. යාපනය අර්ධද්වීපයේ ස්ථාපිත 4 වන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා මධ්‍යම වැඩපළ මීට මාස කිහිපයකට පෙර නිරීක්ෂණය කළ ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ එහිදී ලබාදුන් උපදෙස් මත අයෝග්‍ය කර තිබූ මෙම වාහන කඩිනමින් ක්‍රියාත්මක වී අවම පිරිවැයකින් ධාවනයට යෝග්‍ය තත්වයට පත්කිරීමට කටයුතු කෙරිණ.

මෙම අවස්ථාව සඳහා ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති, සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, 4 වන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ අණදෙන නිලධාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

# දිළිඳු පවුලක් වෙත නව නිවසක්



51 වන සේනාංකයේ මැදිහත්වීමෙන් යාපනය, උඩුවිල් ප්‍රදේශයේ අවශ්‍යතා සහිත පවුලක් වෙනුවෙන් ඉදිකරනු ලැබූ නව නිවසක් ඉකුත් නොවැම්බර් 03 වන දින සංකේතාත්මකව එම නිවාසලාභියා වෙත පවරාදෙන ලදී. හින්දු චාරිත්‍ර වාරිත්‍ර මධ්‍යයේ පැවති මෙම උත්සවය සඳහා යාපනය අර්ධද්වීපයේ සංචාරයක නිරත ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ද සහභාගී විය.

යාපනය අර්ධද්වීපයේ පිහිටි "*American Ceylon Mission*" ක්‍රිස්තියානි දේවස්ථානයේ මූල්‍ය අනුග්‍රාහකත්වය මත ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා 9 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ භටපිරිස්වල ශ්‍රම දායකත්වය, තාක්ෂණික හා ඉංජිනේරු දැනුම ලබාදුන්හ. මෙම උත්සවයේදී නිවාසලාභියා වෙත වියළි සලාක සහ ගෘහ උපකරණද පරිත්‍යාග කෙරිණ. මෙම නව නිවස විවෘත කිරීමේ අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 51 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ඇතුළු පිරිසක්ද සහභාගී වූහ.

---

# මුහුණු ආවරණ පරිත්‍යාග කරයි

ත්‍රිවිධ හමුදා සාමාජිකයින් විසින් සිදුකරන කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීමේ කටයුතු ඇගයීමට ලක් කරමින් කපු, නූල්, රෙදි, කමිස ආදී ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලබන සීමාසහිත *Esquel Sri Lanka* සමාගමේ නියෝජිත පිරිසක් ඉකුත් නොවැම්බර් 23 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් හමු වී කපු වලින් නිෂ්පාදිත මුහුණු ආවරණ තොගයක් පරිත්‍යාග කරන ලදී.

එම අවස්ථාවට සීමාසහිත *Esquel Sri Lanka* සමාග මේ වැඩබලන සාමාන්‍යාධිකාරී රසිකා අමරකෝන් සහ එම සමාගම නියෝජනය කරමින් ආර්.යූ.ඒ. මෙන්ඩිස්, එන්.එස්.ඩී. කුමාරු, එම්.ආර්. ජුන්කීර් යන මහත්ම මහත්මීන් සහභාගී වූහ.









# ‘Sri Lanka Tourism Expo 2021’

*One Galle Face* වෙළඳ සංකීර්ණයේ පිහිටි *Beira Lake* සහ *Ocean Avenue* හිදී පැවති *‘Sri Lanka Tourism Expo 2021’* ප්‍රදර්ශනයේ සමාප්තිය සනිටුහන් කරමින් පසුගිය නොවැම්බර් 21 වන දින පැවති සම්මාන ප්‍රදානෝත්සවයට ගෞරවනීය ආරාධිතයෙකු ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය.

*‘Sri Lanka Tourism Expo 2021’* ප්‍රදර්ශනයේ එක් ප්‍රදර්ශන කුටියක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් "ලයා" හෝටල් සමූහය වෙනුවෙන් වෙන්කර තිබූ අතර එහිදී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආහාර සැපයුම් බලඇණියට අයත් ප්‍රදර්ශන කුටියේදී නරඹන්නන් වෙත සජීවී ආහාර පිසීමේ තරඟ, කොක්ටේල් සහ මොක්ටේල් තරඟ, කේක් සැරසිලි නිෂ්පාදන තරඟ සහ කේක් මාදිලි තරඟ සඳහා සහභාගී වූ යුද්ධ හමුදා සාමාජිකයින් රිදී සහ ලෝකඩ පදක්කම් දිනාගැනීමට සමත්විය.

මෙම උත්සවය අතරතුර, කොළඹ විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ ආර්ථික විද්‍යා අංශය වෙතින් දියත් කරනු ලැබූ සංචාරක කර්මාන්තය පිළිබඳ අධ්‍යයන පාඨමාලාව සඳහා පසුගිය වසර 6 පුරාවට සිය මාර්ගෝපදේශයන් ලබාදෙමින් සංචාරක කර්මාන්තය නගාසිටුවීමට දැක්වූ දායකත්වය ඇගයීමට ලක්කරමින් කොළඹ විශ්වවිද්‍යාලයේ සංචාරක ආර්ථික හා සත්කාරක කළමනාකරණ සංගමයේ සාමාජිකයින් වෙතින් හම්බන්තොට, පලටුපාන ප්‍රදේශයේ පිහිටි "ලයා" සෆාරි හෝටලයේ ප්‍රධාන විධායක නිලධාරි බ්‍රිගේඩියර් ලලිත් හේවා වෙත සමරු තිළිණයක් ද ප්‍රදානය කරන ලදී.

# හිටපු එල්ටීටීඊ සාමාජිකයාට නව නිවසක්





51 වන පාබල සේනාංකයේ මූලිකත්වයෙන් යාපනය, චුන්නාකම් ප්‍රදේශයේ පදිංචි හිටපු එල්ටීටීඊ සාමාජිකයෙකු වෙනුවෙන් නව නිවසක් ඉදිකිරීම සඳහා ඉකුත් නොවැම්බර් 03 වන දින මුල්ගල් තැබිණ. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බලප්‍රදේශයේ සිදුකරනු ලැබූ සංචාරය අතරතුර මෙම අවස්ථාවට සහභාගී විය.

යාපනය ප්‍රදේශයේ ප්‍රසිද්ධ දානපතියෙකු වන ත්‍යාගේන්ද්‍රන් වාමදේව මහතාගේ මූල්‍ය අනුග්‍රාහකත්වය මත සිදුකරනු ලබන මෙම ව්‍යාපෘතිය ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත 51 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ සිදුකරනු ලබයි. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය තාක්ෂණික හා ඉංජිනේරු දැනුම 10 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා භටපිරිස් විසින් ලබාදෙති.

චුන්නාකම් ප්‍රදේශයේ පදිංචි නිවාසලාභියා පුනරුත්ථාපනයට ලක්ව සිට 2021 ජුනි මස 24 දින ජනාධිපති සමාව මත නිදහස් කරනු ලැබූ හිටපු එල්ටීටීඊ සාමාජිකයෙකු වන අතර, සිය දෙමාපියන් ජීවතුන් අතර නොසිටි බැවින් තම එකම සහෝදරිය සමඟ ඔහු තාවකාලික නවාතැනක පදිංචිව සිට ඇත. ඒ පිළිබඳ ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති දැනුවත් කිරීමෙන් අනතුරුව මෙම නව නිවස ඉදිකිරීම සඳහා කටයුතු සම්පාදනය කෙරිණ.



# අභිමානවත් දිනක විශිෂ්ටයින් විසිර ගිය වගයි







මාතෘභූමියේ භෞමික අඛණ්ඩතාවය, දේශයේ ස්වෛරීභාවය මෙන්ම ජාතියේ අභිමානය සුරැකීම උදෙසා විශිෂ්ටයින් අතර විශිෂ්ටයින් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශේෂ බලකායට එක්ව එම පුහුණු පාඨමාලා අංක - 51 යටතේ මාස නවයක අති දුෂ්කර පුහුණුවක් සාර්ථකව හැදෑරූ නිලධාරීන් 7 දෙනෙකු සහ සෙසුනිලයින් 235 දෙනෙකුගේ විසිරයාමේ පෙළපාළිය ඉකුත් නොවැම්බර් 21 වන දින මාදුරුඔය විශේෂ බලකා පුහුණු පාසලේ දී පැවැත්විණි.

විශේෂ බලකා හටපිරිස්වල ගෞරවාචාරය මධ්‍යයේ විශේෂ බලකායේ රෙජිමේන්තු අධිපති මෙන්ම 1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී සහ විශේෂ බලකා පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් ආර්පීඑස් රත්දුණු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ගෞරවනීය පිළිගැනීම මධ්‍යයේ මෙම අභිමානවත් අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය.



පුරා මාස 9 කට අධික කාලයක් පැවැති එම වෙහෙසකර විශේෂ යුද පුහුණුවේදී දරාගැනීම, ශාරීරික හා මානසික ශක්තිය, ආත්ම විශ්වාසය, අධිෂ්ඨානය පෙරදැරිව විශිෂ්ටයින් ලෙස විශේෂ බලකා පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන් කළ සෙබළුන් වෙත පළඳවන විශේෂ බලකා ලාංඡන සරඹ භූමිය වෙත රැගෙන එන ලද්දේද ගුවන් මගිනි.





මෙම විසිරයාමේ පෙළපාළියට ගෞරවයක් එක්කරමින් සපැමිණි ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති විසින් පාඨමාලාව සාර්ථකව අවසන් කළ විශිෂ්ටයින් වෙත විශේෂ බලකා ලාංඡන පැළඳවනු ලැබීය. ඒ සඳහා විශේෂ බලකායේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, ප්‍රගුණ හා සැඟවුණු වෙඩික්කරු පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව්ටීඩබ්ලිව්ජී ඉහලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ද එක්වූහ.



# අන්තර් රෙජිමේන්තු මලල ක්‍රීඩා ශූරතාවලිය 2020 - 2021

නුදුරු අනාගතයේදී තවත් ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ රැසකට බලාපොරොත්තු දල්වමින් පසුගිය නොවැම්බර් 26 වන දින සන්ධ්‍යාවේ කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී "57 වැනි යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු මලල ක්‍රීඩා ශූරතාවලිය 2020-2021" යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

මලල ක්‍රීඩා ශූරතාවලියේ සම්මාන ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා මලල ක්‍රීඩා කමිටුවේ සභාපති සහ 1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ ආරාධනයෙන් ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී විය.

ඉකුත් නොවැම්බර් 22 වන දිනෙන් ආරම්භ වී දින පහක් පුරා ජවන හා පිටිය ක්‍රීඩාවලින් සමන්විතව පැවති මෙම ක්‍රීඩා උළෙලට යුද්ධ හමුදාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 700 කට වැඩි පිරිසක් සහභාගී වූහ. වාර්ෂිකව පවත්වනු ලබන මෙම මලල ක්‍රීඩා ශූරතාවලිය සඳහා යුද්ධ හමුදාවේ සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගී වේ.

තියුණු තරගයකින් අනතුරුව, සමස්ත තරගාවලියේ ජයග්‍රාහකයින් ලෙස ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ ක්‍රීඩකයින් ශූරතා කුසලානය හිමිකර ගත් අතර 2 වන සහ 3 වන ස්ථාන පිළිවෙලින් ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් දිනාගැනීමට සමත් වූහ.

මෙම මලල ක්‍රීඩා ශූරතාවලියේදී නව යුද්ධ හමුදා වාර්තා, ජාතික මට්ටමේ වාර්තා, යුද්ධ හමුදා මලල ක්‍රීඩා තරග වාර්තා පිහිට වූ යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් අතර, ශ්‍රී ලංකා වාර්තා 1 ක්, යුද්ධ හමුදා මලල ක්‍රීඩා වාර්තා 3 ක් සහ තරග වාර්තා 14 ක් ඇතුළත් වේ.










# රුසියානු සමූහාණ්ඩුවේ ආරක්ෂක කවුන්සිලයේ ලේකම් දිවයිනට





ආරක්ෂක අමාත්‍යාංශයේ ආරාධනයකට අනුව රුසියානු සමූහාණ්ඩුවේ ආරක්ෂක කවුන්සිලයේ ලේකම් නිකොලායි පට්රුෂෙව් මහතා (*Nikolai Patrushev*) තෙදින නිල සංචාරයක් සඳහා පසුගිය නොවැම්බර් 22 වන දින දිවයිනට පැමිණියේය. ගුවන් තොටුපළේදී එතුමන් පිළිගැනීමේ අවස්ථාවට ආරක්ෂක ලේකම්, ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති, නාවික හමුදාධිපති සහ ගුවන් හමුදාධිපති එක්වූහ.

---

# ද්විපාර්ශ්වික සාකච්ඡාවක්








රුසියානු සමූහාණ්ඩුවේ ආරක්ෂක කවුන්සිලයේ ලේකම් නිකොලායි පට්රුෂෙව් මහතා (*Nikolai Patrushev*) ඇතුළු රුසියානු නියෝජිත පිරිසක් පසුගිය නොවැම්බර් 22 වන දින හිල්ටන් හෝටලයේදී "රුසියානු - ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික සාකච්ඡාවක්" පැවැත්වූහ.

මේ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ආරක්‍ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් මෙන්ම නාවික සහ ගුවන් හමුදාපතිවරුන්ද පොලිස්පතිද සහභාගී වූහ. මෙම හමුවේදී, රුසියානු සහ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන් අතර ආරක්ෂක සහයෝගීතාව වැඩිදියුණු කිරීමේ හැකියාව පිළිබඳව සාකච්ඡාවට බඳුන්විය.



## මුහමාලේ සටනට පණදුන්

# අභීත විරුවා...



### සෙ/513841 සැරයන් සුරංග පීඑන් පීඩබ්ලිව්වී

ගාල්ල දිස්ත්‍රික්කයේ තලාපිටිය ගමේ පාලපුවෙ නැකතිගේ ඩැනී මහතා හා ඔහුගේ ප්‍රිය භාර්යාව වන නම්මුන්න ආරච්චිගේ ගුණවතී මහත්මිය යන දෙපළගේ නම් ශ්‍රේෂ්ඨ මවකගේ හා පියකුගේ නම් ලෙස ඉතිහාසයට එක් වන්නට නියමිතව තිබුණු බැව් කිසිවෙක් නොදැන සිටියහ. අභීත රණවිරුවන් හා දේශහිතෛෂීන් කවදත් රටට බිහිකළ රුහුණු දේශයේ තවත් එවන් රුහුණු පුත්‍රයෙකු බිහිවන්නේ 1981 වසරේ දෙසැම්බර් 16 වන දිනයේදීය. පාලපුවෙ නැකතිගේ සුරංග නම් වන ඔහු මතු දිනක තලාපිටිය, බණ්ඩාරනායක ප්‍රදේශයට, ගාල්ලට, රුහුණට පමණක් නොව මුළු ලක්දිවටම නව ඉරක් වන බව දැන සිටි කෙනෙක් නැත.

ගාල්ල ඕල්කට් මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලද සුරංග ක්‍රීඩාවට දක්ෂයෙකි. පාපන්දු, ක්‍රිකට්, කරාතේ යන ක්‍රීඩා සඳහා ඔහු පාසල තුළ සිය නම රැන්දුවේය. ඔහුගේ දිවිමගේ සිහිනය සැබෑවන්නේ පාසල් ශිෂ්‍යභට කණ්ඩායමට බැඳීමත් සමගය. "බාලදක්ෂ ව්‍යාපාරය" ඔහුගේ අභිමානවත් බව ගොඩනගන්නට ලැබුණු තවත් පෝෂකයකි.

ශිෂ්‍යභට කණ්ඩායමේ කටයුතු, පාපන්දු ක්‍රීඩාවේ යෙදීම, ඉගෙනීම ඔහුගේ ජීවිතය කාර්යබහුල කළේය. එහෙත් පොදු යහපත වෙනුවෙන් කැපකරන්නට ද ඔහුගේ පැය 24 තුළ ඉඩක් තිබිණි. ඒ නිසා සුරංග ගමේ හොඳ සමාජ සේවකයෙකි. පාසලේ කිනම් කටයුත්තක් තිබුණද සුරංග ඒ සෑම තැනකම දිස්විය.

2000 වර්ෂයේ නොවැම්බර් මස 28 වන දින පාලපුවේ නැකතිගේ සුරංග යුද්ධ හමුදාවට බැඳෙන්නේ රට පිළිබඳව ඔඳ වැඩුණු ජාතිකානුරාගයෙන්මය. 2000 වර්ෂයේ නොවැම්බර් මස 28 වන දින යුද්ධ හමුදාවට ආධුනික සෙබළෙකු වශයෙන් බැඳී යුද්ධ හමුදා ඉංජිනේරු පුහුණු පාසල - තුංකම වෙතින් ආධුනික පුහුණු පාඨමාලා 03 හැදෑරීම සඳහා සුරංග විරුවා ඇතුළත් වූවේය.



සටන් කලාව ප්‍රගුණ කරමින්...

සිය පාඨමාලාව සාර්ථකව හැදෑරූ සුරංග අනතුරුව සෙබළෙකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ඇතුළත් වන්නේ සොලීන්ගෙන් රට මුදවාගෙන 55 වසරක් මහත් අභිමානයෙන් ලක්දෙරණ පාලනය කළ ශ්‍රේෂ්ඨ නරපතියෙකු වූ විජයබාහු රජතුමා සිහිවීම පිණිස ආරම්භ කරන ලද 1 වන විජයබාහු පාබල රෙජිමේන්තුවටය.

මේ අතරතුර සුරංග විවාහ දිවියට එළඹුන අතර, විවාහ දිවියේ සුව විඳි සුරංග සහ නදීකාගේ සුන්දර කැදැල්ල තවත් සුන්දර වූයේ නිසංසලා මධුෂාණි දියණියගේ උපත සමගිනි. බිරිඳගේ සෙනෙහස, දියණියගේ උණුසුම, නිවාඩු දිනක ගමට පැමිණෙන විටෙක පමණක් ලබන්නට හුරු වූ සුරංග, සැමවිට සැදී පැහැදී සිටියේ ලක්මව විපතින් බේරාගැනීම පිළිබඳ පරමාභිලාෂයෙනි.

විවාහ දිවියට එළඹුන ද සුරංග කිසි දිනක තම ජාතික මෙහෙවර අමතක නොකළේය. නිවාඩුව ගෙවන්නටත් පෙර කඳවුරට පැමිණ රට රකින්නට සවියදෙන ගිනි අවිය තුරුලට ගන්නේ රැය දහවල හෝ අව්ව වැස්ස පිළිබඳවද නොතකමිනි.

2003 ඔක්තෝබර් මස 31 වන දින සුරංග සාමාන්‍ය සෙබළ නිලයේ සිට ලාන්ස් කෝප්‍රල් නිලයට උසස් වන්නේ ඔහුගේ සුරුවිරුකම් මනාව වටහාගන්නට යුද්ධ හමුදාව සමත්වූ නිසාය. 2005 නොවැම්බර් මස 01 වන දින ඔහු ලාන්ස් කෝප්‍රල් නිලයේ සිට කෝප්‍රල් දක්වාද නිල උසස්වීම් ලබන්නේය.

මව්බිම බේරාගැනීමට එක දිගට නැගෙන වෙඩි හඬ මැද්දේ උතුරු නැගෙනහිර යුදබිමේ සතුරන් අතර රැඳෙමින්, කල් ගෙවමින් දුෂ්කර හමුදා ජීවිතය සමග සුරංග සිය වීරත්වය සනිටුහන් කළේය. පාලටුවෙ නැකතිගේ සුරංග නම් සෙබළ පුත්‍රයා, පියා, ස්වාමි පුරුෂයා. ඥාතිවරයා කළා වූ උත්කෘෂ්ට

**ත්‍රස්තවාදීන්ගේ ඉදිරි ගමන නොවැලැක්වුවහොත් භූමියද සෙබළුන්ගේ ජීවිතද දැයට අහිමි වන බව සුරංගට පැහැදිලි විය. සුරතට ගත් අත් බෝම්බයේ ආරක්ෂක ඇණය ඉවත් කරමින් ඇත් රැළක් මතට කඩාපනින එකසර කෙසරෙකුසේ ඔහු ත්‍රස්තවාදීන් අතරට කඩාවදිමින් එය පුපුරුවා හැරියේය. අතරැඳි බෝම්බය පුපුරුවා ගනිමින් සතුරු මුවට ගිය ඔහු රුදුරු ත්‍රස්තවාදීන්ගේ ඉදිරිගමන වළකාලමින් ලක්මව වෙනුවෙන් සෙබළෙකුට කළ හැකි උතුම්ම පූජාව පැවැත්වීය.**

දුෂ්කර අභ්‍යාසයට පිරිනැමෙන පූර්ණභූමි පදක්කම ඔහු ලබන්නේ ඒ නිසාය. උතුරු නැගෙනහිර මෙහෙයුම් ප්‍රදේශවල සක්‍රීය දායකත්වය දැක්වීම වෙනුවෙන් පිරිනැමෙන උතුරු මානුෂීය මෙහෙයුම් පදක්කම හා නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම්වල උරුමකරුවෙකු බවටද සුරංග පත්වන්නේ ඉන් අනතුරුවය.

යුද අවිය අත රැඳි සුරංග රණවිරුවා දෙදරු පියෙකු වන්නේ මේ අතරවාරයේදීය. ඒ හිරුෂි ප්‍රබෝධිකාගේ උපත සිදුවීමත් සමගය. දියණියන් දෙදෙනෙකුගේ ආදරයට හෝ ප්‍රිය බිරිඳගේ සෙනෙහසට හෝ රණවිරු සුරංගගේ උදාර චේතනා, අභිමානී හැඟීම් යටපත් කළ නොහැකි විය. කෝප්‍රල් නිලය දරමින් තමන් යටතේ සිටින සෙබළ බලමුළු දිරිගන්වමින් අනාගත දූ දරුවන්ට නිදහස් නිවහල් රටක් තනන්නට ඔහු දිවා රෑ වෙහෙසුණේය.

ඒ සියලු කටයුතු මැද්දේ ඔහු පෙම් බැඳි පාපන්දුවට ද ඔහුගේ සැලකිලි ලැබිණ. සුරංගගේ විවේකයේදී පාපන්දුව ඔහුගේ පා පහරට අවනත වූයේ සතුරු බලමුළු ඔහුගේ සටන්කාමීත්වයෙන් මුළුගැන්වෙන්නා සේය. යාපනය දිස්ත්‍රික්කයේ මුහමාලේ ඉදිරි ආරක්ෂක වළල්ල සංග්‍රාමික වශයෙන් ඉතාමත් වැදගත් මර්මස්ථානයක් විය. යුද්ධ හමුදා හටපිරිස් රැකවල්ලා සිටි එම ඉදිරි ආරක්ෂක වළල්ලට 2006 අගෝස්තු මස 11 වන දින ත්‍රස්තවාදීන් විසින් දැවැන්ත ප්‍රහාරයක් එල්ල කරන ලද අතර, ඒ හේතුවෙන් මුහමාලේ ඒ 9 මාර්ගයේ වූ බංකර් අත්හැර උපක්‍රමශීලීව පසුබැසීමට හටපිරිස් කටයුතු කළේ තව තවත්

දිරියෙන් යුද සැලසුම් සකස් කිරීම සඳහාය. ඒ අනුව පාබල කණ්ඩායම් යොදවා 2006 අගෝස්තු මස 12 වන දින එම ප්‍රදේශය නැවත අත්පත් කරගැනීමට කටයුතු කිරීමේ දී විශාල හටපිරිසක් මියගිය අතර, තවත් පිරිසක් තුවාල ලැබූහ. මෙවැනි බිහිසුණු තීරණාත්මක අවස්ථාවක සුරංග රාජකාරියේ යෙදී සිටි පාබල කණ්ඩායම ක්‍රියාත්විතය සඳහා අවතීර්ණ විය.

2006 අගෝස්තු මස 13 වන දින ත්‍රස්තවාදීන් සමග දරුණු සටන් ඇවිලීගිය අතර, මෙහිදී මුහමාලේ ඉදිරි ආරක්ෂක වළල්ලේ සතුරු ප්‍රහාර මැඩපැවැත්වීමට ඉදිකර තිබූ 11 වන බංකරයේ රැඳී සිටි සුරංග සතුරු බලය බිඳලන තම ආර්පීජී අවියෙන් ඉලක්කයටම ප්‍රහාර එල්ල කළේය. යුද අත්දැකීම් හා මනාව ලැබූ පුහුණුව, සිත තුළ පිරී පැවති අභිමානයත් සමගම මුසුවීම සතුරාගේ ආගමනය වැළැක්වීමට මහත් ප්‍රාකාරයක් විය. 2006 අගෝස්තු මස 13 වන දින රාත්‍රියේ සතුරා ඒ 09 මාර්ගයේ උතුරු ප්‍රදේශයෙන් ඇතුළු වී සෙබළුන් රැඳී සිටි 11 හා 12 වන බංකර් වටකොට දරුණු ප්‍රහාරයක් එල්ල කරන්නට විය. ඒ අවස්ථාවේ දරුණු වූ සතුරා වියරුවෙන් ඉදිරියට ඇදුනි. ලක්මවගේ හටපිරිස් ද රණකාමීත්වය විදහාපාමින් තම දිවි පරදුවට තබා අභීතව සටන් කරමින් දැවැන්ත ප්‍රහාර එල්ල කරමින් රුදුරු ත්‍රස්තවාදීන් අඩපණ කරන්නට කටයුතු කළහ. ප්‍රහාර ක්‍රමයෙන් දරුණු විය. දෛවයේ සරදම සුරංගට බලපෑවේය. ඔහුගේ ආර්පීජී උණ්ඩ අවසන් විය.

බිරිඳ සමග සුරතල් වෙමින් කෙළිකවට බස් කියන දියණියන් දෙදෙනා සුරංගට සිහිවූයේ නැත. ඉදිකඩ අසල ඔහු එන තෙක් දෑස් අයා බලා සිටින ප්‍රිය බිරිඳගේ සොඳුරු වත සිහිවූයේ නැත. ආසිරි පතන මව, පියා මතකයට ආවේ නැත. තමා සමග සටන් වදින සෙබළුන් පමණක් ඔහුට සිහිවිය. මතු දින ලක්මව රකින්නට සැදී පැහැදී සිටින රණකාමී යුද සෙබළුන්ගේ ජීවිත ඔහුට සිහිවිය. සතුරු ග්‍රහණයට හසුවන්නට යන ලක්මව ඔහුට සිහිවිය. **"සමර්ථානං අතිභාරංකං"** යනුවෙන් අදහස් වන තම උපායෙහි, ශිල්පයෙහි සහ වෘත්තියෙහි අති දක්ෂයෙකුට ඉසිලිය නොහැකි මහා බර කුමක්ද? යන විජයබාහු පාබල රෙජිමේන්තුවේ දැක්ම අනුව යන්නට ඔහුට මෙතරම් අගනා, උදාරතර, මොහොතක් නැතැයි සිතුණි.

තලාපිටිය ගම් පියසේ පලවැල කා පෝෂණය වූ ඔහුගේ ගත සිත අභිමානයෙන් පිරීගියේය. වීර මවකගේ දෙතනේ කිරි කළ සයක් බිව් වීර පුතෙකුට උදාර ජන්මභූමිය වෙනුවෙන් කළ නොහැකි කිසිවක් නොවීය. සතුරු බලමුළු හෙළන වෙඩි වර්ෂාව මල් වර්ෂාවක් කොට තකමින් ඉදිරියට දිවගියේ තම දිවිය පුද දී හෝ රට රකිනා සොයුරු සෙබළුන්ගේ දිවි සුරැකීමටය. මහා විජයබාහු නිරිඳුට සහ වුස්සදේව සෙනවියාට හුරුව තිබූ මහා දුන්න සේම සුරංගට හුරුවී තිබූ ආර්පීජී අවිය ඔහු අත නොවීය. ත්‍රස්තවාදීන්ගේ ඉදිරි ගමන නොවැළැක්වුවහොත් භූමියද සෙබළ ජීවිතද දැයට අහිමි වන බව ඔහුට පැහැදිලි විය. සුරතට ගත් අත් බෝම්බයේ ආරක්ෂක ඇණය ඉවත් කරමින් ඇත් රැළක් මතට කඩාපනින එකසර කෙසරෙකුසේ ඔහු ත්‍රස්තවාදීන් අතරට කඩාවදිමින් එය පුපුරුවා හැරියේය. අතරැඳි බෝම්බය පුපුරුවා ගනිමින් සතුරු මුවට ගිය ඔහු රුදුරු ත්‍රස්තවාදීන්ගේ ඉදිරිගමන වළකාලමින් ලක්මව වෙනුවෙන් සෙබළෙකුට කළ හැකි උතුම්ම පූජාව පැවැත්විය.

ඒ විශිෂ්ට රණවිරුවා කර ඇති උදාර මෙහෙවර වෙනුවෙන් දේශපුත්‍ර සම්මානයෙන් හා රට දැය වෙනුවෙන් තම ජීවිතය පූජාකළ උදාරතර රණවිරුවකුට පමණක් පිරිනැමෙන "පරම වීර විභූෂණය" ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් වර්ෂ 2012 ක් වූ මැයි මස 19 වන දින විජයග්‍රහණ සැමරුම් පෙළපාළියේදී රණවිරු පාලපුවෙ නැකතිගේ සුරංගගේ බිරිඳ වන එදිරිවීර වික්‍රමරත්න විජේසිරි කංකානම්ගේ නදීකා සහ ආදරණීය දියණියන් වන නිසංසලා මධුෂානි සහ හිරුෂි ප්‍රබෝධිකා වෙත ගෞරවයෙන් යුතුව ප්‍රදානය කරන ලදී.

යුද්ධ හමුදා මූලස්ථානය විසින් ප්‍රකාශිත
"උත්තමාචාරය" ග්‍රන්ථයෙන් උපුටා ගැනීමකි.

# ජීවන මගට අත්වැලක්



72 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූයූකේඑල්එස් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ උපදෙස් පරිදි 563 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේපීඒ පෙරේරා ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ 21 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු හටපිරිස් විසින් එම බලප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් මළු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය ඔක්තෝබර් 07 වන දින ක්‍රියාත්මක කරනු ලැබූහ.

එම අවස්ථාවට සඳහා 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 563 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, 21 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# නිලධාරී සෙබළ සුබසාධනයට යෝධ පියවරක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ සුබසාධක වෙළඳ සංකීර්ණය හා ශරීර සුවතා මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම පසුගිය ඔක්තෝම්බර් මස 12 වන දින යෙදුණු සුබ මොහොතින් ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මෙන්ම ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් සිදුවිය.

තවද එහි අභිනවයෙන් ඉදිකිරීමට නියමිත ජ්‍යෙෂ්ඨ නිලධාරී නේවාසිකාගාරය සඳහා මුල්ගල තැබීමද ඉකුත් නොවැම්බර් 16 වන දින ශ්‍රීලංයුහසෙව්බමු සේනාවිධායකගේ සුරතින් සිදුකෙරිණ. එම අවස්ථාවන්ට ස්වේච්ඡා බලසේනාවෙහි නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් ජේඩීසීජී ජයසිංහ කේඑස්වී කේඑස්පී ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

---

# ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවෙහි සංචාරයක





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක හා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවෙහි රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පසුගිය ඔක්තෝබර් 25 වන දින ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සංචාරයක නිරත විය. යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූලව සම්මාන මුරයක් හා සම්මාන පෙළපාළියක් පිරිනමමින් සේනාවිධායකතුමන්ට හිමිවූයේ ගෞරවනීය පිළිගැනීමකි. එහිදී එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ අභිනවයෙන් ස්ථාපිත සූර්ය බලශක්ති ජනන ව්‍යාපෘතිය විවෘත කිරීමටද එක්වූ සේනාවිධායක එහි හටපිරිස් ඇමතීමටද අමතක නොකළේය. මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බලසේනාවෙහි මූලික මාණ්ඩලික නිලධාරි බ්‍රිගේඩියර් පීඑන් ගොඩැල්ලවත්ත යූඑස්පී පීඑස්සී සහ පුහුණු පරීක්ෂක බ්‍රිගේඩියර් එස්එන් සමරවික්‍රම කේඑස්පී, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්ඩීඑස්කේ ගුණවර්ධන ආර්එස්පී කේඑස්පී ඇතුළු පිරිසක් එක්වූහ.

# කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ අදහසකට අනුව ලෝක ළමා දිනය සහ ලෝක වැඩිහිටි දිනය නිමිත්තෙන් සංවිධානය කෙරුණු වැඩසටහන් දෙකක් ඉකුත් ඔක්තෝබර් 25 වන දින ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා පාසල - මින්නේරිය හිදී පැවැත්විණ. එහිදී දෙමාපියන්ට සහ දරුවන්ට "සොඳුරු පවුලක රහස" යන තේමාව යටතේ හරවත් දේශනයක් සහ වැඩමුළුවක් මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් අනූෂා ගෝකුල ප්‍රනාන්දු මහත්මිය විසින් සිදුකරන ලදී. එම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශ්‍යාමිණී කොටුවේගොඩ මහත්මිය, එහි සාමාජිකාවන් මෙන්ම එම රෙජිමේන්තු පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් කේඒඩීඑන්ආර් කන්නන්ගර ආර්එස්පී අයිජී ඇතුළු නිලධාරීන්, දෙමාපියන් සහ දරුවන් 90 දෙනෙකු සහභාගී වූහ.

# ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව



16 වන වැඩපළ රෙජිමේන්තුව ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායට අයත් සෙ/241167 කෝප්‍රල් නන්දන ඒඩබ්ලිව්ඩීඩී යන කොනොනි කුකුලේගඟ පුහුණු පාසලේ පාඨමාලාවක් හදාරමින් සිටියදී ඇති වූ අසනීප තත්වයක් හේතුවෙන් මිය යන ලදී. තත් කොනොනිගේ අර්ධ වශයෙන් ඉදිකර තිබූ නිවස ඉදිකර දෙන ලෙස ඔහුගේ බිරිඳ විසින් ඉල්ලීමක් කිරීමෙන් පසු ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව මැදිහත්ව අදාළ නිවසේ ඉදිකිරීම් කටයුතු අවසන් කරදෙනු ලැබීය. එසේ සම්පූර්ණ කරන ලද නිවස ඉකුත් නොවැම්බර් 08 වන දින අදාළ පවුලේ සාමාජිකයින් වෙත භාරදෙනු ලැබූ අතර එම අවස්ථාවට ඉංජිනේරු බලකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඒඑන් අමරසේකර යූඑස්පී එන්ඩීයූ සහ එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ද එක්වූහ.

# විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව



විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ දරුවන් හතර දෙනෙකු 2020 අපොස (උසස් පෙළ) විභාගයෙන් "ඒ" සාමාර්ථ 03 ක් ලබා විශිෂ්ට දස්කම් දක්වා ඇත. එබැවින් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු තවදුරටත් ඉහළ නැංවීම සඳහා විජයබාහු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය අවන්ති පිලපිටිය මහත්මියගේ ප්‍රධානත්වයෙන් සහ සියලු සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් ඔවුන් වෙත ලැප්ටොප් පරිගණක 04 ක් ලබාදීමට කටයුතු කරන ලදී. ඒ නිමිත්තෙන් වූ උත්සවය පසුගිය ඔක්තෝබර් 21 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ.

# විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ 14 වන සංවත්සරයට සමගාමීව, එම රෙජිමේන්තුවට අයත් බළඇණි/වැඩපළ සහ පුහුණු පාසල් හි නිහඬ සේවයක් ඉටු කරනු ලබන සිවිල් සේවක කාර්ය මණ්ඩල සාමාජිකයින් හට මසකට පමණ සරිලන අත්‍යාවශ්‍ය භාණ්ඩ පාර්සල් බෙදාදීමේ වැඩසටහන් මාලාවක් 2021 ජූලි සහ අගෝස්තු මස ඇරඹීය. මෙහි ආරම්භක උත්සවය 2021.07.30 දින රෙම ශ්‍රීලවියාඉ හිදී පවත්වන ලද අතර, ඊට සමගාමීව අනෙකුත් ශ්‍රීලවියාඉ බළඇණි/වැඩපළ සහ පුහුණු පාසල් වෙතින් ද සේවා වනිතා සාමාජිකාවන්ගේ ප්‍රධානත්වයෙන් අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

# ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාව



ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛා ගරු සභාපතිතුමියගේ උපදෙස් මත 16 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ ප්‍රධානත්වයෙන් යුතුව මුලතිව් - මුල්ලියාවේලි හි පිහිටි භාරතී ළමා නිවාසයේ සිටින දරුවන් 98 දෙනෙකු සඳහා පාසල් උපකරණ බෙදාදීමට කටයුතු කෙරිණ.

තවද 5 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව යටතේ රාජකාරී කරනු ලබන ලා/කෝ කරුණාරත්න එම්පී යන කොනොනි ගේ දරුවා සහ ඉසෙ පෙරේරා පීඒයූඑන්එස් යන සෙනිගේ සහෝදරිය උපතේ සිට ඇවිදීමට නොහැකිව ඇති බැවින් ඔවුන් හට යම් සහනයක් වනු පිණිස ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිතුමිය ගේ උපදෙස් මත රෝද පුටු දෙකක් පරිත්‍යාග කිරීමටද කටයුතු කරන ලදී.

# පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාව




3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායට අයත් කෝප්‍රල් ප්‍රසාද් එච්ජ් යන කොනොනි ගේ රෝගාතුරව සිටින ආදරණීය මෑණියන්ගේ සුවදුක් සොයාබලා ඇයට රෝද පුටුවක් ප්‍රදානය කිරීමට යුද්ධ හමුදා පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි එරංගා හේවාවසම් මහත්මිය ඇතුළු එම ශාඛාවේ සාමාජිකාවෝ කටයුතු කළහ. එහිදී කුලියාපිටිය ප්‍රදේශයේ පිහිටි එම සෙබළාගේ නිවසටම ගොස් එම ප්‍රදානය සිදුකළ ඔවුන් එම රණවිරුවාට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළත් වියළි සලාක පාර්සලයක්ද පරිත්‍යාග කරන ලදී.

ඉහත කටයුත්තට සමගාමීව 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් රාජකාරී කරමින් සිටියදී කොරෝනා වෛරසය වැළඳීම හේතුවෙන් හදිසියේ මියගිය බලලත් නිලධාරී 1 ඩීඑම් ගාමිණී ගේ නිවස වෙත ගොස් ඔහුගේ ආදරණීය බිරිඳ සහ දියණියගේ සුවදුක් ද විමසා බැලීමට සේවා වනිතා සාමාජිකාවෝ අමතක නොකළහ. එහිදී වියළි සලාක පරිත්‍යාගයක් සිදුකිරීමටද අධ්‍යාපනය හදාරන එම දියණිය වෙත ශිෂ්‍යාධාර මුදලක් ලබාදීමටද කටයුතු කෙරිණ.

# කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාව

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛා සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මිය ඇතුළු එහි සාමාජිකාවෝ 2021 නොවැම්බර් 18 වන දින උමංදාව මහා විහාර ආශ්‍රමයේ චාරිකාවක නිරත වූහ. උමංදාව විහාර පරිශ්‍රය නිරීක්ෂණය කරමින් එහි සිදුකරනු ලබන කාබනික වගාව පිළිබඳව දැනුවත්භාවය ලබාගැනීමේ අරමුණින් සිදුකළ මෙම සංචාරයේදී කාබනික භෝග යොදාගනිමින් ආහාර පිළියෙල කිරීම පිළිබඳව පෙරහුරුවකට සහභාගී වීමටද ඔවුනට අවස්ථාව ලැබිණ.



එම නිරීක්ෂණ චාරිකාව අවසන සේවා වනිතා සභාපතිනිය ඇතුළු සාමාජිකාවන් විසින් විහාරයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය පරිත්‍යාග කිරීමක්ද සිදුකරනු ලැබූහ. එහිදී ලබාගත් දැනුමද උපයෝගී කරගනිමින් ඉදිරියේදී කාබනික වගාවන් ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලියන් ආරම්භ කර ආදායම් මාර්ග උත්පාදනය කරමින් සේවා වනිතා සාමාජිකාවන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමට එම චාරිකාව හරහා ඔවුනට මහගු අත්වැලක් සැපයිණ.

# සුහද හමුවක මතක සටහන්



ශ්‍රී ලංකාවේ කැනඩා තානාපති ඩේවිඩ් මැකින්නොන් මහතා සහ කොළඹ කැනඩා මහ කොමසාරිස් කාර්යාලයේ දේශපාලන හා ආර්ථික උපදේශක ඩැනියෙල් බූට් මහතා ඉකුත් ඔක්තෝබර් 13 වන දින යාපනය ප්‍රදේශයේ සිදුකරන ලද සංචාරයක් අතරතුර ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවී සුහද සාකච්ඡාවකද නිරතවිය.

එහිදී යුද්ධ හමුදා භටපිරිස් විසින් යාපනය අර්ධද්වීපයේ සිදුකරනු ලබන සිවිල් සම්බන්ධීකරණ කටයුතු, සංස්කෘතික හා ආගමික කටයුතු, ජනතාවගේ ජීවන තත්වය නංවාලීම සඳහා ක්‍රියාත්මක සමාජ සත්කාරක වැඩසටහන් හා කොවිඩ් 19 වෛරසය වැළැක්වීම ආදී කටයුතු පිළිබඳ සාකච්ඡා කරන ලදී.

# ශ්‍රී නාග විහාරයේ වාර්ෂික කඨින පූජෝත්සවය



යාපනය ශ්‍රී නාග විහාරයේ වාර්ෂික කඨින පිංකම ඉකුත් ඔක්තෝබර් 30 සහ 31 යන දෙදින තුළ විහාරාධිකාරී ශාස්ත්‍රපති මීගහජඳුරේ සිරිවිමල ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ගේ මගපෙන්වීම යටතේ පැවැත්විණි. මෙම පුණ්‍යෝත්සවය ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත 51 වන පාබල සේනාංකයේ අධීක්‍ෂණයෙන් 512 වන පාබල බලසේනාව විසින් සංවිධානය කර තිබිණ. මෙම අවස්ථාවට ආගමික නායකයින්, රාජ්‍ය නිලධාරීන්, 51 වන පාබල සේනාංකාධිපති, 511 සහ 512 වන පාබල බලසේනාධිපතිවරු ඇතුළු පිරිසක්ද සහභාගී වූහ.







# සේනාංක සංචාරයක

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සිඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සිය ධුරයෙහි වැඩ භාරගැනීමෙන් අනතුරුව ඉකුත් ඔක්තෝබර් 20, 26, සහ 27 යන තෙදින තුළ 21, 54, 65 සහ 56 වන පාබල සේනාංකයන්හි නිරීක්ෂණ සංචාරයක නිරතවිය. එහිදී එම සේනාංක හා ඊට අයත් බලසේනාවල ක්‍රියාන්විත හා පාලන රාජකාරී මෙන්ම එහි භටපිරිස්වල සුබසාධන කටයුතු පිළිබඳවද හෙතෙම සොයාබැලීය. එම අවස්ථාවට සේනාංකාධිපතිවරු, ඊට අයත් පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු ඇතුළු පිරිසක් එක්වූහ.

---

# නව ධර්ම ශාලාව සඟසතු කරයි



15 වන ඉංජිනේරු සේවා බළකායේ භටපිරිස් සිය තාක්ෂණික දැනුම උපයෝගී කරගනිමින් "පිබිදෙමු පොළොන්නරුව" ව්‍යාපෘතිය යටතේ ඓතිහාසික සෝමාවතිය රජමහා විහාරස්ථාන පරිශ්‍රයේ ඉදිකරනු ලැබූ තෙමහල් ධර්මශාලා ගොඩනැගිල්ලක් ඉකුත් නොවැම්බර් 07 වන දින මල්වතු පාර්ශ්වයේ අනුනායක සහ සෝමාවතිය රජමහා විහාරස්ථානයේ විහාරාධිපති අතිපූජ්‍ය පහමුණේ ශ්‍රී සුමංගල නායක හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවති චාම් උත්සවයකදී සඟසතු කර පූජා කරන ලදී.

මෙම අවස්ථාවට හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා, ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඇතුළු පිරිසක් සහභාගී වූහ. එම විහාරස්ථාන පරිශ්‍රයේ ඉදිකිරීමට යෝජිත සංඝාවාසය, ධාතු මන්දිරය සහ කෞතුකාගාරයට මුල්ගල් තැබීමද එහිදී සිදුවූ අතර, 15 වන ඉංජිනේරු සේවා බළකායේ භටපිරිස් ඒ සඳහා සිය ශ්‍රමදායකත්වය ලබාදීමට නියමිතය.

# සංවත්සරය සමරා රුක් රෝපණයක්





යුද්ධ හමුදාවේ 72 වන සංවත්සර දිනය සනිටුහන් කරමින් ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) හටපිරිස් එකතුව කන්දකාඩු යුද්ධ හමුදා ගොවිපළ පරිශ්‍රයේ පොල් පැළ සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබූහ. ආරක්‍ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ මූලිකත්වයෙන් සිදුකළ මෙම වැඩසටහනේදී පොල් පැළ 2000 ක් රෝපණය කරන ලදී. මෙම අවස්ථාව සඳහා 23 වන සේනාංකයේ සේනාංකාධිපති, ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති ඇතුළු නිලධාරීන්, සෙසුනිලයින් සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව සහභාගී වූහ.

---

# සංචාරයක සටහන්





1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී සිය තනතුරේ වැඩ භාරගැනීමෙන් පසු ඉකුත් ඔක්තෝබර් 31 වන දින 53 වන පාබල සේනාංකයේ සංචාරයක නිරතවිය. එහිදී එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේපීඑස්ඒ ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් හමුදා සම්ප්‍රදායානුකූලව කඳවුරු සම්මාන මුරයක් පිළිගන්වමින් බලකාධිපති ඉමහත් ගෞරවයෙන් පිළිගනු ලැබීය. සිය සංචාරයේදී 53 වන පාබල සේනාංකය වෙත පැවරී ඇති රාජකාරීමය වගකීම්, හටපිරිස් පුහුණු කිරීම් ආදී විවිධ කරුණු සබැඳිව සොයාබැලූ බලකාධිපති ඉදිරියේදී 1 වන බලකාය සමග සම්බන්ධ වී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව දීර්ඝ සාකච්ඡාවකද නිරත විය.

# සේනාංක සංචාරයක





ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති ලෙස වැඩ භාරගත් මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ඉකුත් නොවැම්බර් 19 වන දින 68 වන පාබල සේනාංක මූලස්ථානයේ සහ ඊට අයත් 681 වන හා 682 පාබල බලසේනා මූලස්ථානවල සංචාරයක නිරත විය. එහිදී එම හටපිරිස්වල රාජකාරී ස්වභාවය, පාලන අවශ්‍යතා පිළිබඳ සොයාබැලූ හෙතෙම ඔවුන් හා කතාබස් කිරීමටද අමතක නොකළේය. තවද ආඥාපති කලකට ඉහතදී 682 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස රාජකාරී කර තිබූ අතර එහිදී ඔහු ප්‍රදේශයේ ජීවත්වන සියලු ජනතාවගේ හදවත් දිනාගනිමින් සුහදශීලීව කටයුතු කොට තිබිණ. එබැවින් ඔහුගේ මෙම සංචාරය සැලවීමත් සමග ප්‍රදේශයේ ප්‍රභූන් කිහිපදෙනෙකුම එතුමන් මුණගැසීම සඳහා එම බලසේනා මූලස්ථානය වෙත පැමිණ තිබීමද විශේෂත්වයකි.

# සේනාංක සංචාරයක්





ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ලෙස අභිනවයෙන් රාජකාරී ආරම්භ කළ මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පසුගියදා සිය බලප්‍රදේශයේ පිහිටි 11, 12 වන පාබල සේනාංක, ඒ යටතේ ඇති පාබල බලසේනා සහ ඒකකවල සංචාරයක නිරතවිය. තවද එම සංචාරය තුළ බදුල්ල ජලසම්පාදන ආයතනය, මහජන සෞඛ්‍ය සේවා කාර්යාලය, හාවාඑළිය නවතමයෙන් ඉදිවන නිවාඩු නිකේතනය, කොටගල තෙල් සංස්ථාව, විමලසුරේන්ද්‍ර ජල විදුලි බලාගාරය සහ ලක්ෂපාන ජල විදුලි බලාගාරය ආදී විශේෂ ස්ථානද ඔහුගේ නිරීක්ෂණයට බඳුන්විය.

# වසර නවයක අභිමානවත් ගමන්මග සැමරේ





ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) සිය 9 වන සංවත්සරය ඉකුත් නොවැම්බර් 15 වන දින එහි ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත්යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් හමුදා සම්ප්‍රදායානුකූලව අභිමානවත් අයුරින් සමරන ලදී. එහිදී ආගමික වතාවත්වලට මුල්තැනක් හිමිවූ අතර, එම මූලස්ථානය යටතේ ස්ථාපිත 14 සහ 61 වන සේනාංකවල හටපිරිස් මෙම සංවත්සර සැමරුමට එක්වූහ. බස්නාහිර, වයඹ, සබරගමුව සහ දකුණු පළාත්වල දිස්ත්‍රික්ක 9 ක් ආවරණය වන පරිදි ප්‍රදේශයේ ආරක්ෂක, ජාතික සංවර්ධන හා සමාජ සුභසාධන කටයුතුවල නිරතවන ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) මාහැඟි මෙහෙවරක නිරත ආරක්ෂක සේනාවකි.

# ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ වැඩමුළුවක්



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ රාජකාරී කරනු ලබන නිලධාරීන් සඳහා වූ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ දෙදින වැඩමුළුවක් ඉකුත් නොවැම්බර් 16 සහ 17 යන දෙදින තුළ පනාගොඩ පිහිටි පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත්යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ අධීක්ෂණයෙන් පැවති මෙම පාඨමාලාවට නිලධාරීන් 32 ක් සහභාගී වූහ. රතු කුරුස සංවිධානයෙහි මෙරට නිත්‍ය නියෝජිත *Brig Jacques Lemay (Rtd) - Regional Armed & Security Forces Dlegate* විසින් මෙම වැඩමුළුව මෙහෙයවන ලදී.

# "සිරි සඟබෝ" ළමා නිවාසයට පරිත්‍යාගයක්





බණ්ඩාරවෙල "සිරි සඟබෝ" ළමා නිවාසයේ දරුවන් විසින් කරන ලද ඉල්ලීමකට අනුව ඔවුනට දීර්ඝකාලීනව අඩුපාඩුවක්ව පැවති පිඟන්, කෝප්ප සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමට ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) දායක විය. එහි සිවිල් සම්බන්ධීකරණ කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් සිදුකළ එම පරිත්‍යාග භාරදීමේ අවස්ථාවට ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය. අදාළ ද්‍රව්‍ය භාරදීමට අමතරව එම ළමා නිවාසයේ අලුත්වැඩියා කටයුතු සිදුකර දීමටද එහිදී ආඥාපති මැදිහත් විය.

---

# දැනුවත් කිරීමේ වැඩමුළුවක්







පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන ආයතනයන්හි අරෙසේ/යාකිරීම් මත රාජකාරී සඳහා පැමිණ සිටින නිලධාරීන් හට පුනරුත්ථාපන ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පසුගිය නොවැම්බර් 08 වන දින සිට 12 වන දින දක්වා රණවිරු සම්පත් කේන්ද්‍ර දේශන ශාලාවේදී පවත්වන ලදී.

ඒ සඳහා රණවිරු සෙවණ, අභිමංසල 1,2,3, රණවිරු සම්පත් කේන්ද්‍රය වෙතින් නිලධාරීන් 09 දෙනෙකු සහභාගී වූ අතර, වැඩමුළුව අවසානයේදී පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් අයිඑච්එම්ටීඑච් සේනාරත්න යූඑස්පී අතින් ඔවුන් හට සහතිකපත්‍ර ප්‍රදානය කෙරිණ. එම අවස්ථාව සඳහා නියෝජ්‍ය පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීඩීජ්ජී සේනාධීර යූඑස්පී, රණවිරු සම්පත් කේන්ද්‍රයෙහි ජ්‍යේෂ්ඨ පාඨමාලා සම්බන්ධීකරණ නිලධාරී ඇතුළු නිලධාරීන් රැසක් සහභාගී වූහ.

# විරු දෑතින් හිසට සෙවණක්





653 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ඩීඑන්සී සේරසිංහ ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ සින්නපණ්ඩිවිරිච්චාන්, මඩු ප්‍රදේශයේ ජීවත්වන අඩුආදායම්ලාභී පවුලක් වෙත නව නිවසක් පරිත්‍යාග කිරීම ඉකුත් ඔක්තෝබර් 30 වන දින සිදුකෙරිණ. මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියනයක මූල්‍ය අනුග්‍රහයක් මඩු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ලබාදුන් අතර, එහි ඉදිකිරීම් කටයුතු 24 වන ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් විසින් සිදුකරනු ලැබූහ. මෙම නිවාස ප්‍රදානෝත්සවය සඳහා 65 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, මඩු ප්‍රාදේශීය ලේකම් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මැදිහත්වීම මත 65 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේජී සමරසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ උපදෙස් පරිදි මෙම මාහැඟි කටයුත්ත සිදුවිය.

---

# කුඹුරු අස්වද්දමින්





අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" සංකල්පයට අනුව ශ්‍රී ලංකාව තුළ කාබනික පොහොර යොදා ගනිමින් සිදුකරනු ලබන කුඹුරු අස්වැද්දවීමේ කටයුතු වෙනුවෙන් යුද්ධ හමුදාව වෙතින් ලබාදෙනුයේ සක්‍රීය දායකත්වයකි. ඒ අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ බලකාධිපති බ්‍රිගේඩියර් එච්ජීපීකේ හේවාවසම් ගේ උපදෙස් මත 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායට අයත් අල්ල කන්තලේ පිහිටි ඒකක අනුබණ්ඩයෙහි කුඹුරු අස්වැද්දවීමේ කටයුතු එම අනුබණ්ඩයේ නිලධාරී අණදෙන මේජර් ජීඩබ්ලිව්ජ්එල් සේනාධීර ගේ පූර්ණ අධීක්ෂණයෙන් එහි සියළු නිලයින්ගේ සහභාගීත්වයෙන් හා ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීඑස් දේමුණි ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් නොවැම්බර් 20 දින සිදුකෙරිණ.



# රණවිරුවාණනි, ඔබ දේශයේ ශක්තියයි...!

## "පතිරූප දේස වාසෝච පුබ්බේ ච කතපුඤ්ඤතා"

අප තිලෝගුරු බුදු පියාණන් වහන්සේ මහා මංගල සූත්‍ර දේශනාවේදී විග්‍රහ කරන ලද ඉතා වටිනා මංගල කාරණා අතර, ඉහත දක්වා ඇති මංගල කාරණාවද ඇත. පුද්ගල ජීවිතය අර්ථාන්විත කර ගැනීම සඳහා නිදහස්ව නිවහල්ව ගත කිරීමට සුදුසු වාස භූමියක (දේශයක) ජීවත්වීමට අවස්ථාව ලැබීම මංගල කාරණාවක් බව උන්වහන්සේ පෙන්වාදුන් සේක.

අප මාතෘ භූමිය වූ ශ්‍රී ලංකා ධරණිතලය මේ ලොව පවත්නා ජීවත්වීමට වඩාරණ සුදුසු වාස භූමියයි. පන්දහසක් කල් බුදු දහම රැකී පවතිනුයේ බුදුරදුන් උපන් දේශයේ නොව අපගේම මාතෘ භූමියේ වීමෙන්ම එය පසක් වී ඇත.

අධික හිම පතන නොමැති, අධික ග්‍රීස්ම ඍතු නොමැති කාන්තාර, ගිනිකඳු, හිමකඳු, භූමිකම්පා නොමැති ස්වභාවික වශයෙන් ලොව ජීවත්වීමට යෝග්‍යම දේශය අප මාතෘ භූමියයි.

මෙවන් සුදුසු පරිසරයක් සහිත රටක ජීවත්වන මිනිසුන් හට තම හදවත් පිනෙන් පිරුණු හදවත් බවට පත්කරගැනීමට ඉතා පහසුවන්නා සේම එය පින්බර මිනිසුන්ගේ පෙර කරන ලද පින්බර ශක්තියද අවදිකර ගත හැකිය.

**කිච්ඡෝ මනුස්ස පටිලාභෝ**
**කිච්ඡන් මච්චාන ජීවිතන්**
**කිච්ඡන් සද්ධම්ම සවනන්**
**කිච්ඡෝ බුද්ධාණන් උප්පාදෝ**
**(ධම්ම පදය)**

මේ ලෝකයේ සපුරා ගැනීමට අපහසු වූ දුලබ කරුණු හතරක් බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළහ. මනසින් උසස් වූ මනුෂ්‍යත්වයක් ලැබීමත්, අංගවිකල බවකින් තොරවූ

**මෛත්‍රිය යනු නිවටකම හෝ බයාදුකම නොවේ. බෞද්ධයින් සිංහලයින් තරම් මෛත්‍රී සහගත කරුණාබර මිනිසුන් කොටසක් ලොව සොයා ගැනීමට අපහසුය. අප කිසි කලෙක බුදු දහම ලොව ප්‍රචලිත කිරීමට එකදු ලේ බිඳක් මේ මහ පොළොවෙන් එකතුකර නොමැත. ඒ තුළින්ම අප මොනතරම් ඉහළම මිනිසුන් ප්‍රජාවක් ලෙස ජීවත් වන්නේද යන්න පැහැදිලි වනු ඇත.**

මනුෂ්‍යත්වයක් ලැබීමත්, බුදු බණ ඇසීමත්, බුදුරුව දැකීමත් එම කරුණු හතරයි.

එසේනම් අප ජීවමාන බුදුරුව දැකීමට පින් නොකළාට සෙසු කාරණා ත්‍රිත්වයම සපුරාගෙන සුදුසු වූ වාසභූමියක ඉපදෙන්නට පය ගහන්නට වාසනාවන්තයින් පින්වන්තයින් වී හමාරය.

මෙවන් උතුම් දේශයකට, ජාතියකට සැනසිල්ල ලබාදෙන දහමකට එල්ලවන සතුරු බලපෑම් අපමණය. එසේ නම්

සහෝදර රණවිරුව ඔබ අතෙහි ගිනිඅවි දරා සිටිනුයේ මේ සැනසිල්ල කිසිවෙකුට හෝ විනාශකර දැමිය නොහැකි වීම සඳහාමය. කිසිවෙකුට හෝ උදුරා ගැනීමට ඉඩනොදීම සඳහාමයි.

මෛත්‍රීය යනු නිවටකම හෝ බයාදුකම නොවේ. බෞද්ධයින් සිංහලයින් තරම් මෛත්‍රී සහගත කරුණාබර මිනිසුන් කොටසක් ලොව සොයා ගැනීමට අපහසුය. අප කිසි කලෙක බුදු දහම ලොව ප්‍රචලිත කිරීමට එකදු ලේ බිඳක් මේ මහ පොළොවෙන් එකතුකර නොමැත. ඒ තුළින්ම අප මොනතරම් ඉහළම මිනිසුන් ප්‍රජාවක් ලෙස ජීවත් වන්නේද යන්න පැහැදිලි වනු ඇත.

මේ ලොව පහළ වූ උතුම්ම මිනිසා වූ බුදුරජාණන් වහන්සේ ගේ ගමන නැවැත්වීමට එකළ මිසදිටුවෝ බොහෝ උත්සාහ දැරූහ. මහා ගල් පර්වත පෙරළමින්, දුනුවායන් යොදවමින්, රා පෙවූ හස්තියෙකු ඉදිරියට පමුණුවමින් බුදුරදුන්ගේ ජීවිත හරණය කිරීමට කළ ප්‍රයත්නයන්ගෙන් එය අපට වටහාගත හැක.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඇණ ගසා ඝාතනය කිරීමෙන්, මෑත කාලීනව අවිහිංසාව ගැඹුරින්ම කතා කළ ඉන්දියාවේ මහත්මා ගාන්ධි තුමා වැන්නවුන් නිරපරාදේ මරණයට පත් කිරීමෙන් අපට පසක් වනුයේ මේ ලොව සුන්දර මිනිසෙකුගේ ගමනට බාධා කිරීමට උත්සාහ දරණ ම්ලේච්ඡ මිනිසුන් කොටසක් සිටිනා බවයි.

සහෝදර රණවිරුවාණෙනි, අපගේ මේ සුන්දර දේශයත් සුන්දර හදවත් ඇති ජනතාවත් වැනසීමට එල්ටීටීඊ නම් ම්ලේච්ඡ කොටි ත්‍රස්තවාදීන් උත්සාහ ගත්තද බුද්ධ කාලයේ කලාක් මෙන් ඈත ඉතිහාසයේ කලාක් මෙන් අපේ දේශය අපි රැකගත්තෙමු.

රාජ්‍යයක ස්වෛරීබව ඒකීයබව රැකගැනීමට එනම් සතුරු උවදුරු වලින් ජනතාව හා රාජ්‍ය සතු භෞතික සම්පත් රැකගැනීමට රටක් සතුව ප්‍රබල හමුදාවක් සිටිය යුතුය. බුදුරජාණන් වහන්සේ මෙකී කාරණා, එනම් රාජ්‍යයක ප්‍රබල ආරක්ෂිත පද්ධතියකින් එම රාජ්‍යයේ පැවැත්ම තහවුරු වන බව දේශනා කළහ.

**අපහට සරණ වන තෙරුවන් වැඩඉන්න**
**මේ සිරිලක් දෙරණ පණමෙන් රැක ගන්න**
**කුමරුන් දුටුගැමුණු නිරතුරු සමරන්න**
**ඔබ ඒ පරපුරේ බව සිහියට ගන්න**



**රාජ්‍යයක ස්වෛරීබව ඒකීයබව රැකගැනීමට, එනම් සතුරු උවදුරුවලින් ජනතාව හා රාජ්‍ය සතු භෞතික සම්පත් රැකගැනීමට රටක් සතුව ප්‍රබල හමුදාවක් සිටිය යුතුය. බුදුරජාණන් වහන්සේ මෙකී කාරණා, එනම් රාජ්‍යයක ප්‍රබල ආරක්ෂිත පද්ධතියකින් එම රාජ්‍යයේ පැවැත්ම තහවුරු වන බව දේශනා කළහ.**

අංගුත්තර නිකායේ 7 වන නිපාතයේ ඇති නගරූපම සූත්‍රය තුළින් මෙකී කරුණු තවදුරටත් ගැඹුරින් පැහැදිලි කරගත හැක. එහිදී බුදුරජාණන් වහන්සේ නගරයක, රටක ආරක්ෂාව තහවුරු කරගැනීමට එකළ යොදාගන්නා ක්‍රම හතක් පිළිබඳව දේශනා කළහ. එම කාරණා හත මෙසේය.

- **ඒසිකා ස්ථම්භය** - කළුගලින් ඉතාමත් උසට ගොඩනගන ලද ආරක්ෂක කුටියකින් සමන්විත වූ නිරීක්ෂණ කුළුණ.
- **පරිකාව** - ගැඹුරු දිය අගල
- **අනුපරියාය පථය** - නගරය හෝ රට අභ්‍යන්තරයට වන්නට තනන ලද තාප්පය. නිරීක්ෂණ කටයුතු කරමින් සෙබළු මෙහි ගමන් කරති.
- **දියුණු අවිවලින් සමන්විත වූ ශක්තිමත් අවි ගබඩාව**
- **දක්ෂ හමුදා අනුබණ්ඩය** - ඇත්, අස්, රිය, පාබල යන චතුරංගනී සේනාවෙන් සමන්විතය.
- **නුවණැති දක්ෂ දොරටුපාලකයින්**
- **නගරයට හෝ රටට පිටතින් පිහිටි ප්‍රාකාරය** - කුඩා සිදුරක්වත් නොමැති වන ලෙස ශක්තිමත්ව මේ ප්‍රකාරය තනා ඇත.



ඉහත උපමා හත මගින් නගරයක, රටක සුරක්ෂිතබව ආරක්ෂාවන්නා සේම පුද්ගල ජීවිතයද කෙලෙස් වසඟයෙන් රැකගැනීමට තිබිය යුතු කරුණු හතක් මෙලෙස දේශනා කළහ.

| | |
|---|---|
| ශ්‍රද්ධා | - සැදැහැති බව (තෙරුවන් විෂයෙහි) |
| හිරිය | - පවට ඇති ලැජ්ජාව |
| ඔත්තප්පය | - පවට ඇති බිය |
| බහුස්සතෝ | - දහම් දැනුම |
| විරිය | - වීර්යමත් බව |
| සති | - සිහියෙන් කටයුතු කිරීම |
| පඤ්ඤා | - ප්‍රඥාව හෙවත් බුද්ධිමත් බව |

**රණවිරුවාණෙනි, ඔබේ රැකියාව දැහැමි රැකියාවක් බව ඔබ දන්නවාද?**

සම්මා සම්බුදුරජාණන් වහන්සේ කළ යුතු දැහැමි රැකියාවන් හෙවත් කර්මාන්ත කිහිපයක් පිළිබඳ අංගුත්තර නිකායේ පස්වන කොටසට අයත් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ මෙසේ පෙන්වා දී ඇත.

යේන කම්මට්ඨානේන ජීවකං කප්පෙති
යදි කසියා යදි වණිජ්ජා යදි ගො රක්ඛේන
යදි ඉස්සත්ථේන යදි රාජ පෝරිසේන
යදි සිප්පඤ්ඤතරේන

එනම්,
කෘෂිකර්මාන්තය, වෙළඳාම, ගව පාලනය, දුණු ශිල්පය, රාජ්‍ය සේවය, වෙනත් ශිල්ප කලා

හමුදා සේවයද ඉහත සඳහන් රාජ්‍ය සේවය යටතට වැටේ, රට දැය හා ආගම සතුරු ආක්‍රමණයන්ගෙන් ආරක්ෂා කරගනු ලබනුයේ රාජ්‍ය සේවකයින් වන හමුදා සෙබළුන් විසිනි.

එම නිසා ආරක්ෂක හමුදාවෝ රටක කොඳුනාරටිය බඳුය. බුදුරජාණන් වහන්සේ දැහැමි රැකියාවන් කළ යුතු අයුරු මෙසේ අර්ථ දක්වා ඇත.

උට්ඨාන වීර්යාධිගතා
බාහාබල පරිචිතා
සේදා වක්ඛිත්තා
ධම්මිකා ධම්මලද්දා

තම කරන රැකියාව, උත්සාහයෙන් සහ වීර්යයෙන් කළ යුතුයි. බාහු බලයෙන් දහඩිය වගුරවමින් කළ යුතුය. රණවිරුවනි, ඔබගේ රැකියාවේ ඉහත සෑම කරුණක්ම අන්තර්ගත නොවන්නේද? උත්සාහයෙන්, වීර්යයෙන් බාහු බලයෙන් දහඩිය වගුරවමින් රැකියාවේ නියැලෙන්නේ ඔබම නොවේද? එහෙව් ඔබට අප සැමගේ උත්තමාචාරය වේවා....!

**ජාතිභේද දුරලා එක්රොක් වන්න**
**සතුරන් පරදවා ලක්බිම රැකගන්න**
**සාමය සතුට සිරිලක රජ කරවන්න**
**පෙර රජ දවස මෙන් අප රට බබලන්න**

සටහන
**පූජ්‍ය මොරවත්තේ සුබෝධි හිමි**
**සම්මාජීව බෞද්ධ ආශ්‍රමය, මිනුවන්ගොඩ**

# හදිසි ප්‍රතිකාර ඒකක ගොඩනැගිල්ලක් නවීකරණයට



ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ 70 වන සංවත්සරයට සමගාමීව එම රෙජිමේන්තු හටපිරිස් විසින් රණවිරු සෙවණ - රාගම හි හදිසි ප්‍රතිකාර ඒකක ගොඩනැගිල්ලක නවීකරණ කටයුතු සිදුකරනු ලැබූහ. එසේ නවීකරණය කරන ලද ගොඩනැගිල්ල නැවත විවෘත කිරීමේ උත්සවය ඉකුත් නොවැම්බර් 13 වන දින ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඒඑන් අමරසේකර යූඑස්පී එන්ඩීයූ සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ශිරෝමි අමරසේකර මහත්මියගේ ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී.





# වොලිබෝලයෙන් එතෙර මෙතෙර දිනූ රණවිරු හපන්කම්

වත්මන් යුද්ධ හමුදාධිපති, මාණ්ඩලික ප්‍රධානී වශයෙන් රාජකාරී භාරගැනීමෙන් අනතුරුව ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් පියවර රැසක් ගනු ලැබීය. එහිදී වොලිබෝල් ක්‍රීඩාව පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන ලදී. ඒ වනවිට යුද්ධ හමුදා වොලිබෝල් කණ්ඩායමට 2009 වසරට පෙර වසර 10 ක කාලය තුළ ජාතික ශූරතා, ආරක්ෂක සේවා ශූරතා මෙන්ම වෙනත් ජාතික මට්ටමේ ජයග්‍රහණ කිසිවක් කරා යාමට නොහැකිව තිබිණ. එහිදී එතුමන් එතෙක් පැවති වොලිබෝල් පරිපාලනයේ වෙනස්කම් කිහිපයක් සිදුකර නව කමිටුව වෙත නිසි උපදෙස් ලබාදෙමින් සිදුකළ අධීක්ෂණය හා මඟපෙන්වීම හේතුවෙන් කෙටි කාලයක් තුළ වොලිබෝල් ක්‍රීඩාවෙන් ජාතික තලය අතික්‍රමණය කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා වොලිබෝල් කණ්ඩායම සමත් වූහ.

එතැන් පටන් මේ දක්වා යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ අවස්ථා 07 කදී වොලිබෝල් ඉතිහාසය වෙනස් කරමින් පහත සඳහන් ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ ලබාගැනීමට සමත්ව ඇත.

**ජාතික ජයග්‍රහණ**

- 2019 ජාතික රූපවාහිනී අභියෝගතා ශූරතාවය
- 2019 ජාතික වොලිබෝල් ශූරතාව - පිරිමි (වසර 10 කට පසුව)
- 2020 ආරක්ෂක සේවා වොලිබෝල් ශූරතාවය - පිරිමි (වසර 10 කට පසුව)
- 2020 බීච් වොලිබෝල් ආරක්ෂක සේවා ශූරතාවය -කාන්තා (ප්‍රථම වරට)
- 2021 ජාතික වොලිබෝල් ශූරතාව - කාන්තා (ප්‍රථම වරට)

**ජාත්‍යන්තර ජයග්‍රහණ**

- 2019 දකුණු ආසියානු බීච් වොලිබෝල් කාන්තා රන් පදක්කම (ක්‍රීඩිකාවන් දෙදෙනාගෙන් එක් ක්‍රීඩිකාවක් යුද්ධ හමුදා ක්‍රීඩිකාවක් වීම - (සෙ/ආර්101400 ලා/කෝප්‍රල් වීරසිංහ කේජීසීඑම් - ශ්‍රීලයුකාබ) - (ප්‍රථම වරට)
- 2019 දකුණු ආසියානු බීච් වොලිබෝල් පිරිමි රිදී පදක්කම (ක්‍රීඩකයින් දෙදෙනාම යුද්ධ හමුදා ක්‍රීඩකයින් වීම - (සෙ/279313 සැරයන් ජයතිලක කේඒකේඅයිටී ශ්‍රීලංසංබ, සෙ/579331 සැරයන් සනුජ පීකේජේටී ශ්‍රීලයුසේබ) - (ප්‍රථම වරට)
- 2019 ලෝක හමුදා ක්‍රීඩා උළෙලේ යුද්ධ හමුදා කණ්ඩායම *Fare Play* කුසලානය දිනාගැනීම - (ප්‍රථම වරට)

- 2021 ආසියානු මධ්‍යම කලාපීය සුදුස්සන් තේරීමේ තරගයේ උස්බෙකිස්ථානය සමඟ පවත්වා ජයගත් තරගාවලියේ ජාතික කණ්ඩායමට යුද්ධ හමුදා ක්‍රීඩකයින් සිව්දෙනෙක් ක්‍රීඩා කිරීම.

- 2021 ආසියාතික බීච් වොලිබෝල් ශූරතාවය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරන කණ්ඩායම් දෙකෙන් අංක 1 දක්ෂතම කණ්ඩායම වශයෙන් යුද්ධ හමුදා කණ්ඩායම ඉදිරිපත් වීම - (ප්‍රථම වරට)

ඉහත ජයග්‍රහණ හා දක්ෂතා වර්ධනය කරගැනීමේදී පෙර වසරවලට වඩා ක්‍රීඩා උපකරණ හා එම පහසුකම් ඉතා සුදුසු පරිදි නියමිත වේලාවට යුද්ධ හමුදාව වෙත සපයාදීමද මේ සඳහා පිටුවහලක් වූ බැව් යුද්ධ හමුදා වොලිබෝල් කමිටුව විසින් විශේෂයෙන් සඳහන් කරයි. මෙහි තවත් විශේෂත්වයක් වන්නේ පෙර වසර 10 තුළ පිරිමි/කාන්තා වොලිබෝල් කණ්ඩායම් පුහුණු කිරීම සඳහා සිවිල් පුහුණුකරුවන් සඳහා විශාල මුදලක් වැය කළද එම කාලය තුළ නොලද ජයග්‍රහණ රැසක් ඔවුන් ඉවත් කිරීමෙන් අනතුරුව යුද්ධ හමුදා පුහුණුකරුවන් හරහා ලබාගැනීමට හැකි වීමයි.



**2019 වොලිබෝල් ජාතික රූපවාහිනී අභියෝගතා ශූරතාවය**



**2019 ජාතික වොලිබෝල් ශූරතාවය - පිරිමි**



**2020 බීච් වොලිබෝල් ජාතික ශූරතාවය - පිරිමි**



**2020 බීච් වොලිබෝල් ආරක්ෂක සේවා ශූරතාවය - පිරිමි**





**2020 බීච් වොලිබෝල් ආරක්ෂක සේවා ශූරතාවය - කාන්තා**



**2021 ජාතික වොලිබෝල් ශූරතාවය - කාන්තා**



**2019 ලෝක හමුදා ක්‍රීඩා උළෙලේ යුද්ධ හමුදා කණ්ඩායම *Fare Play* කුසලානය දිනාගැනීම**



## දෙවන ලෝක යුද්ධයේ

# ළාබාලතම විරුවා...

යුද්ධයක් කියන්නෙ කොහෙත්ම සුන්දර දෙයක් හෝ උත්කර්ෂයට නැගිය යුතු දෙයක් නෙවෙයි. ඉතිහාසෙ පුරාවටම යුද්ධ වලින් ලෝකයට කරේ අවැඩක් විතරයි. ඒ වගේම යුද්ධයට මැදිවූ ළමුන් කිව්වහම අපේ හිත් වලට එන්නෙ පහන් හැඟීමකුත් නෙවෙයි. "ළමා සොල්දාදුවො" කිව්වාම ඒක තවත් දරුණුයි සහ අවුල්. නිවැරදි සිහියෙන් හිටියා නම් ඔබටත් මතක ඇති ම්ලේච්ඡ එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසිනුත් ඔවුන්ගේ ඊනියා "විමුක්තිය" නාමයෙන් කුඩා දරුවන්ව බලෙන් සටන් පෙරමුණු වලට එව්වා.

විශාල ජීවිත කන්දරාවක් වගේම හීන කඳු පිටින් ගිනිබත් කරපු දෙවෙනි ලෝක යුද්ධය, කාටවත් වරදක් කරලා නැති අහිංසක ළපටි පොහොට්ටු මිලියන 13 කට ආසන්න ප්‍රමාණයක් පිපෙන්න කලින් පොඩිකරලා දාලා තියෙනවා. තවත් සෑහෙන පිරිසක් වධකාගාර වල අනන්ත දුක්ඛ දෝමනස්සයන්ට ගොදුරු වෙලා තියෙනවා. ඒ අතරෙ තවත් සමහරුන්ට සිද්ධ වුණා තමන්ටත් වඩා උස තුවක්කු අමෝරාගෙන මහ මිනිස්සු එක්ක හරි හරියට යුද්ධ කරන්න; අකමැත්තෙන් වුණත්. හුරතල් වයසේදී මේ වගෙ දරුණු වැඩ කරන්න සිද්ධවෙනව කියන්නෙම සෑහෙන ඛේදවාචකයක්.

මේ කියන්න යන්නෙ එක් ළමා සොල්දාදුවෙක් ගැන; දෙවන ලෝක යුද්ධයට සහභාගී වෙච්ච. දැනට තියෙන වාර්තා අනුව දෙවන ලෝක යුද්ධයේ සටන් කරපු ළාබාලතම සොල්දාදුවා කිව්වොත් මම වැරදි නෑ කියලා හිතනවා. වයස අවුරුදු හයේදී සිය මව්බිම වෙනුවෙන් සටන් වැදුණු මේ කුඩා දරුවා හැබෑ වීරයෙක්. ඔහු නමින් සෙර්ගේයි ඇලෙෂ්කොව්. බොහෝමයක් රුසියානුවන්ට වගේම සෙර්ගේයිටත් තමන්ගෙ නමින් බිඳිල ආපු සුරතල් නමක් එහෙමත් නැත්තන් *Nick name* එකක් තිබුණා. ඒ තමයි සයෝෂා. මොහු උපත ලැබුවෙ රුසියාවෙ කලුගා කියන පළාතෙ. "පාටිසාන් වරු" හෙවත් සෝවියට් දේශය වෙනුවෙන් සටන් වැදුණු ස්වේච්ඡා භටයන්ට උපකාර කිරීමේ වරදට ඔහුගේ මව සහ වැඩිමහල් සහෝදරයාව ජර්මානුවන් විසින් ඝාතනය කරන්නේ ඔහුගේ ඇස් ඉදිරිපිටදීමයි. අසල්වැසි කාන්තාවක් විසින් මෙයාව ජර්මානුවන්ගෙන් හංගගෙන ඉඳලා පලා යන්න උදව් කරලා තියෙනවා.

යන එන මං නොදැන කලුගා වනාන්තරයට පිවිසෙන මේ අවුරුදු හයේ පුංචි කොලුගැටයා වනාන්තරයේ, අතට අහුවෙන දේ කමින් දවස් ගණනාවක් ඇවිදිනවා. අහස කොයිවෙලේ ගිනියමට ඇදහැලෙයිද කියල කියන්න බැරි තරමට ඔන්න මෙන්න අඳුරු වෙලා තිබ්බ දවසක, කලුගා වනාන්තරයේ විමර්ශන රාජකාරියකට ගිහින් හිටපු සෝවියට් හමුදාවෙ 142 වන රයිෆල් රෙජිමේන්තුවෙ සොල්දාදුවො පිරිසකට කැලේ වැටිලා ඉඳලා හම්බවෙනකොට පුංචි සියෝෂා හිටියේ මැක්කන් සහ නොයෙකුත් කෘමීන්ගේ අඩන්තේට්ටම් වලට ලක් වෙලා ඇඟ පුරා තුවාල සහ කැලැල් සහිතව බොහොම දුක්ඛදායක තත්වයකයි. ඉතිං කැලේ මැද්දෙදි අහම්බෙන් හම්බුණ, කාත් කවුරුත් නැති මේ කොලු පැටියව තමන්ගේ කඳවුරට අරගෙන යන්න අර භට පිරිස තීරණය කරනවා.

රෙජිමේන්තුවෙ අණදෙන නිලධාරී තැන වෙච්චි මේජර් මිහයිල් වොර්බයොව් විසින් මේ කුඩා දරුවා ඔවුන්ගේ රැකවරණය යටතේ තියාගන්නවා. කාත් කවුරුවත් නැති මේ





දරුවව අනාථ නිවාසයකට යවන්නේ අකමැති වන අණදෙන නිලධාරී තැන, ඔහුව සිය රෙජිමේන්තුව සමඟ තබාගැනීම වඩාත් ආරක්ෂිත යැයි සිතනවා. දරුවාද සොල්දාදුවන් අතරේ සිටීමට මහත් ප්‍රියතාවයක් දැක්වීමත් එයට එක් හේතුවක්. ගෙවල් දොරවල්, ගම්බිම් වලින් බොහොම ඈත දුරක ඉඳගෙන, මාස ගණන් තමන්ගේ පවුල් වලින් ඈත් වෙලා හිටි සෝවියට් සොල්දාදුවන් හැමෝටම සියෝෂා "තමන්ගෙ" දරුවෙක් වුණා. රෙජිමේන්තුවෙ කාගෙත් හුරතලේට ලක් වෙච්ච් මේ කොලු පැංචාට "රෙජිමේන්තුවේ පුත්‍රයා" *(Son of the Regiment)* කියන සුරතල් නම පටබැඳෙන්නෙ ඔය කාලෙදි.

නිකරුණේ සිටීමට අකමැති වූ මේ කොලු ගැටයා වෙහෙස මහන්සි නොබලා ඉදිරි වළල්ලේ සටන් වදින රතු හමුදා සොල්දාදුවන්ට උපරිම සහයෝගය දෙනවා. විටෙක රෙජිමේන්තුව තුළ පත්තර හා ලියුම් බෙදමින් වගේම අණදෙන නිලධාරී තැනගේ පණිවුඩ, උප ප්‍රධාන නිලධාරීන් වෙත ගෙනයමින් කාලය ගත කරපු කුඩා සියෝෂා තවත් විටෙක ඉදිරි පෙරමුණෙහි සටන් වදින සෙබළුන් වෙත පතුරම් රැගෙනයන්නටත්, රණ ගී ගයමින් සෙබළුන් දිරිමත් කරන්නටත් පුරුදු වෙලා හිටියා. මේ අතරෙ ඔහුට, තමන්ගෙ ශරීර ප්‍රමාණයට සරිලන ආකාරයේ නිල ඇඳුමක් පවා ලැබෙනවා.

දිනක් සිය සුපුරුදු රාජකාරීන්හි නිරත වෙලා ඉන්න අතරතුරේ මොහු දකිනවා පිදුරු ගොඩක් අසල අමුතු යමක්. ඒ ගැන සැක හිතිලා තවදුරටත් නිරීක්ෂණය කරපු මොහු දුන්න ඔත්තුව නිසාවෙන් ඒ පිදුරු ගොඩේ හැංගිලා, කාලතුවක්කු ඉලක්ක දෙන්න ඔත්තු බලමින් හිටි ජර්මානු සෙබළුන් දෙදෙනෙක් (***Target Spotters***) අල්ලගන්න හැකිවෙනවා. ඒ සිද්ධියෙන් සියෝෂා රෙජිමේන්තුවෙ තියෙන "තැන" තවත් වැඩිවෙනව. ඉතින් වෙඩි සද්ද, මහ ගිනි කෙළි අස්සෙ කාලය ඔහොම ගෙවීගෙන යන අතරතුර මේජර් වොර්බයෙව් විසින් සියෝෂා දරුකමට හදාගන්න තීරණය කරනවා.

වර්ෂ 1942 අගෝස්තු මාසෙ, දෙවෙනි ලෝක යුද්ධයේ වෙච්ච් දරුණුතම යුද්ධ වලින් එකක් වෙච්ච ස්ටාලින්ග්‍රාඩ් සංග්‍රාමය ආරම්භ වෙන්නේ හිට්ලර්ගේ නාසි හමුදාව විසින් දියත් කරපු, ස්ටාලින්ග්‍රාඩ් නගරය (වර්තමානයෙහි එය වොල්ගොග්‍රාඩ් ලෙස හඳුන්වනවා) විශාල ආක්‍රමණයට එරෙහිවයි. සෝවියට් සෙබළු ලක්ෂ දෙකකට ආසන්න ප්‍රමාණයක් මේ සංග්‍රාමයේදි තමන්ගෙ මාතෘ භූමිය වෙනුවෙන් ණය ගෙව්වා.

යුද්දෙ බොහොම සැරට ඇවිලීගෙන යන කාලෙ, ඒ කියන්නෙ 1942 නොවැම්බර් මාසෙ 142 වන රයිෆල් රෙජිමේන්තුව ස්ටාලින්ග්‍රාඩ් වෙත අනුයුක්ත කරනවා. එක්තරා සටනකදී පොළොව ඉරා වැටෙන කාලතුවක්කු සහ ගුවන් ප්‍රහාර හමුවේ යුද අගලක පස් කණ්ඩියකට තමන්ගේ පියා හිරවෙලා ඉන්නවා දකින සියෝෂා වහාම ගිහින් අනෙකුත් රතු සෙබළුන්ගේද උදව්වෙන් තමන්ගේ අණදෙන නිලධාරියා වගේම තාත්තව බේරගන්නෙ ජර්මානු හමුදාවෙ ගුවන් ප්‍රහාර මැද්දෙමයි. මේ සිද්ධියෙන් සියෝෂා වගේම තවත් සෙබළුන් කීප දෙනෙක් තුවාල ලබනවා. ඒ දක්වපු වීර ක්‍රියාව හේතුවෙන් සියෝෂාට, රතු හමුදාවේ නිර්භීතකම වෙනුවෙන් පිදෙන ***For Combat Merit*** පදක්කම පිරිනමනු ලබනවා.

ඔය කාලෙ මේ රෙජිමේන්තුවට අනුයුක්ත වෙලා හිටිය වෛද්‍ය කණ්ඩායමේ හිටිය නීනා නමැති හෙදිය තමයි පුංචි සියෝෂා ප්‍රතිකාර කරන්නේ. අවිවාහක තරුණියක් වෙච්ච නීනා සියෝෂා කෙරේ දක්වන්නෙ පුදුම ආදරයක්. කොහොමින් කොහොම හරි ස්ටාලින්ග්‍රාඩ් සංග්‍රාමය අහවර වෙද්දි ඔය ආදරේට හැකිවෙනවා මේජර් වොර්බොයෙව් සහ නීනාව එක වහලක් යටට එකතු කරවන්න. සියෝෂාට ඔන්න දැන් අම්මෙකුත් ලැබෙනවා. ඒ විවාහයෙන් ඔවුන්ට එක් දියණියක් සහ පුතුන් තිදෙනෙක් ලැබෙනවා. එතකොට සියෝෂා එක්ක පහයි.

කොහොම වුණත් සියෝෂාට යුද්ධයෙන් නම් අඩුවක් නැතුවම බැට ලැබුණා. දෙවරක්ම ජර්මානු ගුවන් නියමුවන්ගේ මැෂින් තුවක්කු වලට ගොදුරු වෙච්ච මොහු ගමන් ගත් රථය එක් වරක් පීඩන බෝම්බයකට පවා හසු වෙනවා. ඒ සෑම අවස්ථාවකදීම වගෙ දෛවය හිටියෙ සියෝෂාගෙ පැත්තෙ. සෑහෙන තුවාල ලැබුවත් පණ බේරගන්න අපේ වීරයා සමත් වෙනව.

වසර 1945 දෙවන ලෝක යුද්ධය නිමාවත් සමගම, සෝවියට් හමුදාවෙ මාර්ෂල් වරයෙක් වෙච්ච වසීලි චුයිකොව් ගේ ඉල්ලීමක් පරිදි සියෝෂා සවිරොව් නගරයේ යුද විද්‍යාලයට ඇතුළත් වෙලා අධ්‍යාපනය හදාරනවා. 1954 දී පාසල් අධ්‍යාපනය සාර්ථකව නිම කරන සෙර්ගේයි නීතිය හදාරන්නට පටන් ගන්නවා.



Семья М. Д. Воробьева. С. Алешков — во втором ряду, в центре.

ඊටපස්සෙ ඔහු දිගටම නීතිවේදියෙක් විදියට තමයි කටයුතු කරන්නෙ. නීතිවේදියෙක් විදියට දිවුරුම් දුන්නට පස්සෙ, සිය දෙමව්පියන් වෙසෙන චෙල්‍යාබින්ස්ක් ප්‍රදේශයේ පදිංචියට යනවා. එහිදී විවාපත් වන මොහු ආදරණීය දියණියකගේ සහ පුතෙකුගේ සෙනෙහස ලබන්න වාසනාවන්ත වෙනවා.

සෙර්ගේයි එහෙමත් නැත්නම් සියෝෂා 1990 වර්ෂයේදී මිය යන්නේ බස් නැවතුම්පොළකදීයි. යුද්ධයට හිරවෙච්ච බාලවිය විසින් ඔහුගේ ශරීරයට සහ සෞඛ්‍ය තත්ත්වයට කිසිදා නොමැකෙන කැළැල් ඇතිකරනවා. ඒ බලපෑම හේතුවෙන්,සිය ජීවිතයේ සැඳෑ සමය මොහු ගතකරන්නෙ නිරෝගි සුවයෙන් නම් නෙවෙයි.

සියෝෂා ළමාවිය අළලා චිත්‍රපටයක් පවා නිර්මාණය වෙනවා. *Soldatik* හෙවත් *Soldier boy* යන නමින් 2019 වසරෙ රිදී තිරයට එන මේ චිත්‍රපටය රචනාව සහ අධ්‍යක්ෂණය කරන්නේ රුසියානු ජාතික *Viktoria Fanasiutina* විසින්. *IMDB* අගය 6.3 ක් වන මේ සලරුව ගැන *Rotten Tomatoes* හි නම් කිසිදු සඳහනක් නැහැ. හොයාගෙන බලනවා නම් අපූරු චිත්‍රපටියක්.

බාලවයස්කරුවන් යුද කටයුතු සඳහා සහභාගී කරවීම දෙවන ලෝක යුද්ධයේදී බහුලව සිදුවෙච්ච දෙයක්. මම මුලින්ම කිව්වා වගේ සැහෙන ළමා ජීවිත ගණනාවක් යුද්ධය විසින් බිලිගත්තා වගේම අඳුරු කරා. ඒ අතරින් සෙර්ගේයි කියන්නෙ අති වාසනාවන්ත දරුවෙක් කිව්වොත් ඔබ මා සමග එකඟ වේවි කියලා හිතනවා. කිසිම යුද්ධයක් අවසාන වෙන්නෙ ජයග්‍රහණයකින් නෙවෙයි, අනාගතයට සැහෙන වැදගත් වෙන පාඩම් රැසක් උගන්නලා. යුද්ධයකදී වීරයන් බිහි වුණාට යුද්ධයක වීරත්වයක් නෑ. අපි තේරුම් ගන්න ඕන සත්‍යය අන්න ඒකයි. ඒත් එක්කම මම මේ ලිපියට නැවතීමේ තිත තියන්නේ සකල ලෝ වාසීන්ගේ "සිත් තුළ මෙත් මල් පිබිදේවා" කියන ප්‍රාර්ථනාවත් එක්කමයි.

සටහන
**මේජර් චතුරංග විතානගේ - ශ්‍රීලවියාඅ**

---

# වියළි සළාක පරිත්‍යාගයක්



561 වන පාබල බලසේනාව යටතේ පාලනය වන 16 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සහ 17 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවේ හටපිරිස් විසින් ප්‍රදේශයේ ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල් 50 ක් සඳහා වියළි සලාක මළු 50 ක් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 17 වන දින කනගරායන්කුලම් මහා විද්‍යාලයේදී පැවැත්විණ. මේ සඳහා අනුග්‍රහය "මනුෂ්‍යත්වයේ සහන යාත්‍රාව" පදනමේ ප්‍රසාද් ලොකුබාලසූරිය මහතා විසින් සිදුකරන ලදී. 561 වන පාබල බලසේනාවේ බලසේනාධිපති විසින් මෙම වැඩසටහන අධීක්ෂණය කරනු ලැබූ අතර, එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූයූකේඑල්එස් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහභාගී විය.

---

# මාහැඟි පරිත්‍යාගයක්



4 වන ගැමුණු හේවා බලඇණි බලප්‍රදේශයට අයත් උන්නච්චිය සහ අයිත්තමලෙයි ප්‍රදේශයේ ජීවත්වන කොවිඩ් 19 වෛරසය ආසාදිතව සිට නිරෝගී සුවය ලැබූ සිවිල් පුද්ගලයින් 50 දෙනෙකු වෙත දැනට පවතින ආර්ථික අපහසුතාවයන් මඟහරවා ගැනීම පිණිස වියළි සලාක මළු තොගයක් පරිත්‍යාග කිරීම මඩකලපුව උන්නච්චිය රජයේ දමිළ මිශ්‍ර පාසලේදී පැවැත්විණ. සුපෙම් ද සිල්වා මහතාගේ මූල්‍ය දායකත්වය මත බෙදාදුන් මෙම වියළි සලාක මල්ලක් රුපියල් 7000.00 ක වටිනාකමකින් යුක්තය. 72 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඒඑන්එන් කොස්වත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ අදහසකට අනුව මෙම මාහැඟි කටයුත්ත සිදුවිය.

# බලසේනා මූලස්ථානයේ සංචාරයක නිරත වෙමින්



ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ එම තනතුරෙහි රාජකාරී භාරගැනීමෙන් අනතුරුව පසුගිය නොවැම්බර් 15 වන දින 12 වන පාබල සේනාංකය යටතේ පාලනය වන 121 වන පාබල බලසේනා මූලස්ථානයෙහි සංචාරයක නිරත විය. මෙම සංචාරය සඳහා 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඒඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# රට ගොඩනගන මෙහෙයට දැනුම






කෘෂිකර්ම හා පශු සම්පත් ක්ෂේත්‍රයේ ඉහළම ඉලක්ක සපුරා ගැනීම සඳහා වන දැනුම හා අත්දැකීම් ලබාගැනීමේ අරමුණ පෙරදැරිව අරලගංවිල පිහිටි කෘෂිකර්ම පුහුණු පාසල වෙතින් පවත්වන ලද ප්‍රථම මූලික කෘෂිකර්ම පාඨමාලාව ඉකුත් නොවැම්බර් මස 13 වන දින නිමා වූ අතර ඊට විවිධ රෙජිමේන්තුවලට අයත් කොමිෂන් නොලත් නිලධාරීන් හා සෙසු නිලයන් 50 දෙනෙකු සහභාගී වූහ. එහි සමාප්ති උත්සවයට ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බලකායේ කර්නල් සේනාවිධායක,මේජර් ජෙනරාල් ඩබ්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ගේ අතින් පාඨමාලා නිමකළ අයවලුන්ට සහතික පත් ප්‍රදානය කරන ලදී.



# සෙබළ අයියණ්ඩි



සටහන
මේජර් ජෙනරාල් කීර්ති කෝට්ටවත්ත
(විශ්‍රාමික)

මගේ මතකයේ හැටියට ඒ "රිවිරැස" ක්‍රියාන්විතය සිදුවූ සමයයි. යාපනය අර්ධද්වීපය *L.T.T.E* ග්‍රහණයෙන් මුදවා ගැනීම අරමුණු කොට එම ක්‍රියාන්විතය සැලසුම් කර තිබූ අතර, මම තරුණ කපිතාන් වරයෙකු ලෙස හට කණ්ඩායමකට අණ දෙමින් ඊට සහභාගි වී සිටියෙමි. එවකට තෙලිප්පලේ දක්වා විහිදී තිබූ පලාලි ඉදිරි ආරක්ෂක කලාපයේ සිට යාපනය නගරය දෙසට ක්‍රියාන්විතය සැලසුම් කර තිබූ අතර ක්‍රියාන්විතයේ අවසන් ඉලක්කය වී තිබුණේ යාපනය නගරය අත්පත්කර ගැනීමයි. ත්‍රස්තවාදීන්ද සිය ප්‍රධාන බලකොටුවක් මෙන්ම අභිමානයද වූ යාපනය නගරය අප ආරක්ෂක හමුදාවන් අතට පත්වීම වැළැක්වීමට සිය උපරිම යුධ ශක්තිය මුදාහරිමින් තිබුණි. භූමියේ වාසිය ඔවුන් සතුව තිබීම හේතුකොට ගෙන අපට තිබූ අභියෝගය සහ තර්ජනය සුළුපටු නොවීය. සතුරු ස්නයිපර් ප්‍රහාර, බිම් බෝම්බ සහ මර උගුල් ඉදිරි ගමනට විශාල තර්ජනයක් වුවද අප හමුදාවෝ සීරුවෙන් යාපනය දෙසට ගමන් කරමින් තිබුණි.

මාගේ හට කණ්ඩායමට පැවරී තිබුණේ යාපනය-තෙලිප්පලෙයි මාර්ගය ආවරණය කරමින් යාපනය දෙසට ගමන් කිරීම වූ අතර, සාපේක්ෂව ගොඩනැගිලි බහුලව තිබූ මෙම අක්ෂය *(Axis)* දිගේ යාම තරමක් අසීරු කරුණක් විය. හට කණ්ඩායමේ කණ්ඩ (***Platoon***) 2 ක් ප්‍රධාන පාරෙන් වම් පසටත් එක් කණ්ඩායමක් දකුණු පසටත් වන ලෙස අනෙකුත් හට කණ්ඩායම් සමග මා ඉදිරි ගමන ඇරඹූ අතර, කණ්ඩායමේ අනිත් කණ්ඩය අතිරේක කණ්ඩය ලෙස පිටු පසින් ගමන් කරන ලදී. ත්‍රස්තවාදීන්ගේ ස්නයිපර් ප්‍රහාර බිම් වෙඩි සහ මර උගුල්වලට හසුව ඒ වන විටත් සෙබළුන් කීපදෙනෙකුම මියගොස් සහ තුවාල ලබා තිබුණද මහත් කැපවීමෙන් නිර්භීතව සටන් වැදුණු සෙසු සෙබළු සිය අවසන් ඉලක්කය වෙත ළඟා වෙමින් සිටියහ.

සෙබළ ජයසිරි මාගේ හට කණ්ඩායමේ සිටි සෙබළෙකි. අ.පො.ස. සාමාන්‍ය පෙළ ඉතා ඉහළින් සමත්ව උසස් පෙළ හදාරමින් සිටියදී යුධ හමුදාවට බැඳී තිබූ ඔහු යමක් ක්ෂණිකව තේරුම් ගැනීමට දක්ෂතාවය තිබූ අයෙකි. ඔහුගේ දක්ෂතා නිසා මම ඔහුව මගේ කණ්ඩායම් මූලස්ථානයේ ලිපිකරුවෙකු ලෙස පත්කර තිබූ අතර ප්‍රහාරාත්මක ක්‍රියාන්විතයන්හිදී (*Offensive Operation*) මෙහෙයුම සම්බන්ධ හට කාර්ය සම්පාදන කටයුතු වලට (***Logistics***) අනුයුක්ත කළෙමි. ඉතා දක්ෂ ලෙස

එම කටයුතු ඉටු කරනු ලැබූ මොහු අන් සෙබළුන්ට සාපේක්ෂව මඳක් නිවුණු ගති ඇත්තෙකුද විය. වරක් මොහු සම්මුඛ පරීක්ෂණයකට භාජනය කළ විටෙක ඔහු මට පවසා සිටියේ සිය පියා ඔත්පලව එකතැන්ව සිටින බව සහ උසස් පෙළ හදාරන නැගණියක සහ සාමාන්‍ය පෙළ හදාරන බාල සොහොයුරෙකු මොහුට සිටින බවයි. වැඩිදුරටත් ඔහු මට පවසා සිටියේ පවුලේ නඩත්තුව සඳහා ඔහුගේ මව රසකැවිලි සාදා ප්‍රදේශයේ කඩවලට දැමීමේ ව්‍යාපාරයක් කළද සිය පවුලේ නඩත්තුවට එය ප්‍රමාණවත් නොවූයෙන් සහ සිය සහෝදර සහෝදරියන් හට ඉහළ අධ්‍යාපනයක් දීමේ අදිටනින් උසස් පෙළ විභාගයද අතහැර දමා යුද්ධ හමුදාවට බැඳුණු බවයි. බලාපොරොත්තු සහගතව ඔහු මට වැඩිදුරත් පවසා සිටියේ, "නංගියි මල්ලියි ඉගෙන ගන්න දක්ෂයි සර්. මං ඒ දෙන්නව කොහොම හරි ගොඩදානවා" යනුවෙනි.

ක්‍රියාන්විතයේ අවසන් ඉලක්කය වූ යාපනය නගරයට අප ආසන්න වෙත්ම ත්‍රස්ත ප්‍රහාර වඩා තීව්‍ර වූ අතර, යාපනය විශ්වවිද්‍යාලය ආසන්නයේ දරුණු සටන් ඇවිලුණි. කෙසේ වුවද තදබල ත්‍රස්ත ප්‍රහාර මධ්‍යයේ මගේ භට කණ්ඩායමට යාපනය විශ්වවිද්‍යාලයට ඇතුළුවීමට හැකි වූ අතර දැඩි පරිශ්‍රමයකින් පසු විශ්වවිද්‍යාල භූමියේ සහ අවට බලය තහවුරු කරගැනීමට අපිට හැකිවිය. මේ අතර, හදිසියේම ඉදිරියේ සිටි අපගේ භට කණ්ඩයට බරපතල ප්‍රහාරයක් එල්ල වූ අතර, තත්වය පාලනය කිරීම සඳහා ඔවුන්ගේ සහායට අතිරේක කණ්ඩයක් සමඟ මම ද එහි ගියෙමි. දරුණු සටනකින් පසුව සතුරු ප්‍රහාරය මඩ පැවැත්වීමට අපට හැකි වුවද මාගේ සෙබළුන් කිහිපදෙනෙකු එහිදීද දිවිපුදා තිබුණි. මියගිය සෙබළුන් අතර අතිරේක භට කණ්ඩය සමඟ ගිය සෙබළ ජයසිරිද විය. ප්‍රහාරයට පසු දින මියගිය සෙබළුන්ගේ පුද්ගලික බඩුභාහිරාදිය නෑදෑයින් වෙත ලබාදීමට කටයුතු සූදානම් කර සිටියදී කණ්ඩායම් භාර සැරයන් මේජර් පැමිණ මට දන්වා සිටියේ සෙබළ ජයසිරි නමට පෙර දිනයේ ලිපියක් ලැබී ඇති බවයි. මඳක් සැලෙන සිතින් යුතුව මම එය විවෘත කළෙමි. එය ඔහුට සිය නැගණිය විසින් එවන ලද්දකි. එහි සඳහන්ව තිබුනේ ඇය ඉතා හොඳින් සිය අධ්‍යාපන කටයුතු කරගෙන යන බව සහ ළඟ එන උසස් පෙළ විභාගය ජය ගැනීමට ඇයට දැඩි ආත්ම විශ්වාසයක් ඇති බවයි. විශේෂයෙන්ම ඇය ඔහුගෙන් ඉල්ලීමක් කර තිබුනේ සිය 18 වන උපන් දිනයදා කෙසේ හෝ නිවසට පැමිණෙන ලෙසයි. අවාසනාවකට ඔහු මියගොස් තිබුනේද ඔහුගේ නැගණියගේ උපන් දිනයදාමය. සිය නැගණියත්, මලණුවනුත් සමාජයේ ඉහළට ඔසවා තැබීමට මෙම මියගිය සෙබළා ගත් අපමණ වෙහෙස සිහිපත් වත්ම ලිපියේ අකුරු ක්‍රමයෙන් බොඳව යන අයුරු මට දැනුණු අතර, මෙම සෙබළා කෙරෙහි මෙන්ම, මා කිසිදා නොදුටු ඔහුගේ නැගණිය කෙරෙහිද ඇතිවූ අපමණ වේදනාවකින් යුතුව මම එම ලිපිය ගුලිකර අසල තිබූ අතහැර දමන ලද සතුරු බංකරයට විසිකළෙමි.

# දිස්ත්‍රික් රණවිරු සංවිධාන අතර හමුවක්






ශ්‍රී ලංකාවේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් අති විශිෂ්ට සේවාවක් ඉටුකොට මියගිය යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ළඟම ඥාතීන් හා විශ්‍රාම ගොස් සිටින යුද්ධ හමුදා සාමාජිකයින් හට අභිමානවත් ලෙස නිසි ගෞරවයක් හා පිළිගැනීමක් සහිතව ජීවත්වීම සඳහා පරිසරය ගොඩනැගීම අනිවාර්ය අවශ්‍යතාවයක්ව ඇත. ඒ අනුව දිවයින පුරා විසිරී සිටින විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින් හා මියගිය අයවළුන්ගේ ළඟම ඥාතීන් ආරක්ෂක සේනා මූලස්ථාන බලප්‍රදේශ යටතේ දිස්ත්‍රික් වශයෙන් සංවිධානය කොට රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධතාවයෙන් යුතුව දිස්ත්‍රික් රණවිරු සංවිධාන ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.

ඒ අනුව රණවිරු සේවා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එම් මායාදුන්න ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් යුතුව ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ට අයත් නුවරඑළිය, බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කයන්හි අධීක්ෂණ නිලධාරීන්, රණවිරු සංවිධානවල ප්‍රධාන නියෝජිතයින් මෙන්ම ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ජ්‍යෙෂ්ඨ රණවිරු සංවිධාන පරිපාලන නිලධාරීන්ගේ හමුවක් ඉකුත් නොවැම්බර් 01 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) හිදී පවත්වන ලදී. එහිදී එම රණවිරු සංවිධානයන්හි පවතින ගැටළු සඳහා විසඳුම් ලබාදෙමින් ඉදිරි සැලසුම් සාර්ථක කර ගැනීම අපේක්ෂිතය.

# කැපවීමට දිරිදෙමින්





පසුගිය දින කිහිපය තුළ පැවති අයහපත් කාලගුණ තත්වය හේතුවෙන් දිවයින පුරා ජල ගැලීම්, නායයෑම්, පස්කඳු කඩාවැටීම්, මාර්ග අවහිරවීම් වැනි ස්වභාවික විපත් රාශියක් සිදුවිය. එම විපත්වලදී සිවිල් ජනතාව මුදාගැනීම හා ඔවුන්ගේ ජනජීවිතය නැවත යථා තත්වයට පත් කිරීමට යුද්ධ හමුදා භටපිරිස් දක්වන ලද්දේ අසීමිත දායකත්වයකි. ඒ අනුව එසේ සිදුකළ කැපකිරීම වෙනුවෙන් ඔවුන් දිරි ගැන්වීම සහ සේවය ඇගයීම පිණිස ඔවුන් වෙත සහතික පත් ප්‍රදානය කිරීමට ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ කටයුතු කරන ලදී.

---

# විරු සරණින් නව නිවසක්





ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) යටතේ පාලනය වන 10 වන ගජබා රෙජිමේන්තුවේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ධන පරිත්‍යාගයෙන් හා ශ්‍රම දායකත්වයෙන් ඉදිකරනු ලැබූ නව නිවසක් ඉකුත් ඔක්තෝබර් 23 වන දින පත්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බැද්දේගම ග්‍රාමසේවා වසමේ පදිංචි චාලට් වේලාරත්න යන මහත්මිය වෙත පරිත්‍යාග කරන ලදී. 111 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ටීඑම්ආර්බී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් එම නිවස භාරදීමේ අවස්ථාව සඳහා 10 වන ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් සෙසුනිලයින් හා ගම්වැසියන් පිරිසක් සහභාගී වූහ.



# රණවිරු දිවිය දිනවන තෝතැන්න
# යුද්ධ හමුදා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය........

**කලාඔය සාලියවැව පිහිටි යුද්ධ හමුදා වෘත්තීය පුහුණු පාසල විශ්‍රාම ලබන රණවිරුවන්ගේ දිවිමග සරු කරන තෝතැන්නක් බවට වර්තමානයේ පත්ව ඇත. රට වෙනුවෙන් තම ලේ දහඩිය ශ්‍රමය කැපකොට වසර 22 හා වසර 15 ලෙස තම සේවා කාලය අවසන් කොට විශ්‍රාම ලබන සෙබළුන් හා සෙබළියන්ට යුද්ධ හමුදාවේ ගෞරවය රැකෙන පරිදි අභිමානවත් විශ්‍රාම දිවියක් ගෙවන්නට අවැසි අත්වැල සපයන යුද්ධ හමුදාවේ ප්‍රධානතම පුහුණු පාසල ලෙස මෙම වෘත්තීය පුහුණු පාසල ඉටුකරනුයේ අම්ල මෙහෙවරකි.**

එවකට අතිගරු ජනාධිපතිව සිටි මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ සහ එවකට ආරක්ෂක ලේකම්ව සිටි වර්තමාන අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ සංකල්පයකට අනුව එතෙක් කොනොනි පුහුණු පාසල නමින් පැවති මෙම වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය යුද හමුදාවෙන් විශ්‍රාම යනු ලබන සෙබළ සෙබළියන් හට විශ්‍රාම පූර්ව පාඨමාලා හැදෑරීම සඳහා "පුහුණුවෙන් අභිවෘද්ධිය" යන තේමා පාඨය යටතේ 2016 වර්ෂයේ මැයි මස 10 වන දින සිට යුද්ධ හමුදා වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය නමින් ආරම්භ කරන ලදී.

එතැන් පටන් ඇරඹි මෙම පුහුණු මධ්‍යස්ථානය වෙතින් මේ වන විට විශ්‍රාම යාමට නියමිතව සිටින හා සේවයේ යෙදී සිටින සෙබළ සෙබළියන් 4127 ක් පාඨමාලා හදාරා ඇති අතර, යුද්ධ හමුදා පුහුණු අණසක සහ රණවිරු සේවා අධ්‍යක්ෂ



**සේනාවිධායක**
**බ්‍රිගේඩියර් ඩබ්ලිව්එස්කේ**
**ලියනවඩුගේ ආර්එස්පී**



**අණදෙන නිලධාරී**
**කර්නල් වයිඑම්එස්සීබී**
**ජයතිලක ආර්එස්පී යූඑස්පී**

මණ්ඩලයේ අධීක්ෂණය යටතේ වෘත්තීය පුහුණු අධිකාරිය *(Vocational Training Authority)* සමග සම්බන්ධතාවයෙන් වෘත්තීය දැනුම වර්ධනය කර ගැනීමට අවශ්‍ය දැනුම් සම්භාර ලබා දෙනු ලබයි.

වෘත්තීය පුහුණු අධිකාරියේ උපදේශකයින්ගේ මනා කැපවීම මත සෙබළ සෙබළියන් හට තමන්ගේ වෘත්තීයමය දැනුම වර්ධනය කරගැනීම සහ ඔවුන් ජාතික නිපුණතා මට්ටමට රැගෙන ගොස් ඔවුන්ගේ යුද්ධ හමුදා ජීවිතය මෙන්ම සිවිල් ජීවිතයද ආලෝකමත් කර ගැනීමට අවශ්‍ය මංපෙත් විවර කරදීම මෙම පුහුණු මධ්‍යස්ථානය වෙතින් සිදුකරනු ලබයි.

එහි දැක්ම, පරමාර්ථය හා ඉලක්කයන් වනුයේ සේවයේ යෙදී සිටීමේදී හා විශ්‍රාම යාමෙන් පසු සහය හෝ අධීක්ෂණයකින් තොරව යෙදිය හැකි ඉතා උසස් වෘත්තීය ශිල්පියෙකු බිහි කිරීම තුළින් ජාතිය ගොඩනැගීමේ කාර්යයට උරදීමයි. නිපුනත්වයෙන්

වෘත්තියෙහි යෙදීමට අවශ්‍ය සියලුම න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම එහි පරමාර්ථය වේ.

මෙම පුහුණු පාසල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක කිරීමේ ඉලක්ක පහත සඳහන් පරිදි වේ.

- හදාරන පාඨමාලාවේ ඉහළටම ළඟාවීමේ අවශ්‍ය (*NVQ - IV* සහ ඉහළ) දැනුවත් කිරීම්, දෛනිකව හා අවශ්‍ය පහසුකම් ලබාදීම.

- යුද්ධ හමුදා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ දැක්ම හා පරමාර්ථයන් ළඟා කර ගැනීමට අවශ්‍ය පහසුකම් වැඩි කිරීම, පුහුණුවීම්වල තත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීම හා අවශ්‍ය සම්පත් ලබාදීම.

- යුද්ධ හමුදා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයෙන් ලබාදෙනු ලබන සහතිකයට නිසි පිළිගැනීමක් හා වලංගුතාවයක් ඇති කිරීමට කටයුතු කිරීම හා දක්ෂ, වැඩදායී හා විනය ගරුක වෘත්තීය සෙබළුන් බිහි කිරීමට අවශ්‍ය නිර්නායකයන් අඛණ්ඩව පවත්වාගෙන යාම.

- සිසුන්ගේ නායකත්වය, පරිපාලනය හා කළමනාකරණ කුසලතාවය ඉහළ නැංවීම.

- ජාතිය ගොඩනැගීමේ කාර්ය සඳහා අවශ්‍ය වෘත්තීයමය වැඩකරන අයවලුන් බිහි කිරීම.

- ස්වයං රැකියා අවශ්‍යතාවයන් හා ස්වයං ව්‍යවසායකත්වය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම හා ඒ සඳහා දිරිමත් කිරීම.

- නායකත්වය, සමාජ සාරධර්ම, අන්තර් පුද්ගලික සන්නිවේදනය සිවිල් හා කම්කරු නීතිරීති හා ආහාර කළමනාකරණය වැනි විෂයන් පිළිබඳ දැනුම ලබාදීම හා ආනයන රැකියා අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය මානව සම්පත් කළමනාකරණය හා ව්‍යාපාර සංවර්ධනයට අවශ්‍ය දැනුම ලබාදීම.

- සෙබළුන් විශ්‍රාම යාමෙන් පසු ගෞරවාන්විතව සිවිල් සමාජයට අනුගතවීමට හා ජාතික වශයෙන් කළ සේවයට අගෞරවයක් නොවන ලෙස විශ්‍රාම දිවිය ගත කිරීමට අවශ්‍ය පුහුණුව හා දැනුම ලබාදීම.

## පාඨමාලා සඳහා වූ ප්‍රායෝගික පුහුණුවීම්



වඩු කාර්මික පාඨමාලාව



ජලනල කාර්මික පාඨමාලාව



ඇළුමිනියම් ශිල්පී පාඨමාලාව



කෘෂි උපකරණ නඩත්තු පාඨමාලාව



ගොඩනැගිලි ඉදිකිරීම් පාඨමාලාව



පෑස්සුම් ශිල්පී පාඨමාලාව



විදුලි කාර්මික ශිල්පී පාඨමාලාව



සම් පාවහන් පාඨමාලාව

## වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය ඇතුළත කරනු ලබන පාඨමාලාවන්

| පාඨමාලාවන් | පාඨමාලා කාලසීමාව | ජාතික නිපුණතා සහතිකය |
|---|---|---|
| ඇලුමීනියම් පිරික්සුම් පාඨමාලාව | මාස - 12 | NVQ IV |
| කෘෂි උපකරණ නඩත්තු පාඨමාලාව | මාස - 12 | NVQ III |
| ගොඩනැගිලි ඉදිකිරීම් පාඨමාලාව | මාස - 06 | NVQ III |
| විදුලි කාර්මික ශිල්පී පාඨමාලාව (ගෘහස්ථ) | මාස - 06 | NVQ III |
| පෑස්සුම් ශිල්පී පාඨමාලාව | මාස - 06 | NVQ III |
| සම් පාවහන් පාඨමාලාව | මාස - 06 | NVQ III |

## වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන අධීක්ෂණය යටතේ පිටත කරනු ලබන පාඨමාලාවන්

| පාඨමාලාවන් | පාඨමාලා කාලසීමාව | ජාතික නිපුණතා සහතිකය |
|---|---|---|
| බේකරි ශිල්පී පාඨමාලාව | මාස - 06 | NVQ IV |
| සූපවේදී පාඨමාලාව | මාස - 06 | NVQ IV |
| භෝජනාගාර සහායක ශිල්පී පාඨමාලාව | මාස - 06 | NVQ IV |
| කෘෂිකර්ම පාඨමාලාව - අරලගංවිල | මාස - 03 | NVQ III |
| පැළ තවාන් ශිල්පී පාඨමාලාව | මාස - 04 | NVQ III |
| භූතල දර්ශක ශිල්පී පාඨමාලාව | මාස - 06 | NVQ III |

යුද්ධ හමුදා ඉදිරි දැක්ම (*2020 - 2025 SLAWFS*) අනුව මෙම පුහුණු මධ්‍යස්ථානය මගින් යුද්ධ හමුදාවේ වෘත්තීය කාර්යයන් ඉටුකර ගැනීමට හා රට ගොඩනැගීමේ ක්‍රියාදාමයට උරදීමට අවශ්‍ය වෘත්තීය සෙබළුන් බිහිකරලීමට පහත සඳහන් පියවරයන් ගනිමින් සිටියි.

- පවතින ඇබෑර්තු වලට අමතරව තවත් ඇබෑර්තු 5 බැගින් පාඨමාලා සඳහා ඇතුළත් කිරීම, ඊට අවශ්‍ය ප්‍රතිපාදන හා වෘත්තිය පුහුණු අධිකාරිය *(VTA)* එකඟතාවය ලබාගැනීමට ඉදිරි කටයුතු සිදුකර ඇත.

- පවතින පාඨමාලාවලට අමතරව වර්තමානයට ගැළපෙන හා යුද්ධ හමුදාවට අවශ්‍ය පාඨමාලාවන් ඇතුළත් කිරීමට පියවර ගනිමින් සිටින අතර, පහත සඳහන් පාඨමාලාවන් ඇතුළත් කිරීමට වෘත්තීය පුහුණු අධිකාරිය *(VTA)* සමඟ සාකච්ඡා කරමින් පවතී.

    - පරිගණක හා ජංගම දුරකථන කාර්මික ශිල්පී පාඨමාලාව
    - වායු සමීකරණ හා ශීතකරණ කාර්මික ශිල්පී පාඨමාලාව
    - කැමරා ශිල්පී පාඨමාලාව
    - ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී පාඨමාලාව
    - දෙමහුන් දක්ෂණය සහ වාහන ඉලෙක්ට්‍රෝනික් පාඨමාලාව

සටහන



යුද්ධ හමුදා
වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය,
කළාඔය

# සංවත්සර දින මතක සටහන්





ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායට අයත් රණවිරුවන් සිහිකිරීමේ උත්සවයක් ඉකුත් ඔක්තෝබර් 14 වන දින 1 වන රෙජිමේන්තු යුද්ධ හමුදා යුධෝපකරණ බලකා රණවිරු ස්මාරකය අභියසදී එම බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ආර්පී වීරසිංහ යූඑස්පී ඒටීඕ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එම බලකායේ 72 වන සංවත්සරය නිමිත්තෙන් පැවති එම සැමරුමේදී රට දැය ආරක්‍ෂා කිරීමට තම ප්‍රාණ දානය කැපකළ එම රණවිරුවන්ගේ සේවය අගයා ඔවුන්ගේ පවුල්වල ඥාතීන් හට අත්‍යාවශ්‍ය වියළි ආහාර මළු ලබාදීමට ද කටයුතු කෙරිණ. එම අවස්ථාවට රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු පිරිසක් සහභාගි වූහ.

# නව පැසිපන්දු පිටියක්



12 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ නිලධාරීන් හා සෙසුනිලයින්ගේ ක්‍රීඩා කුසලතාවන් වැඩිදියුණු කිරීම සඳහා නවතමයෙන් ඉදිකරන ලද පැසිපන්දු ක්‍රීඩා පිටියක් එම ඒකක අණදෙන නිලධාරී මේජර් යූඑල්ඩීඑස් ගුණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ සුරතින් ඉකුත් නොවැම්බර් 05 වන දින විවෘත කෙරිණ.

# රුක් රෝපණයට උරදෙමින්





සියඹලාණ්ඩුව කොටියාගල රක්ෂිතය තුළ සිවිල් වැසියන් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන ඇති ඉඩම්වල මී, කුඹුක්, ඇත්දෙමට, කොස්, සියඹලා පැළ රෝපණය කිරීමේ වැඩසටහනක් ඉකුත් නොවැම්බර් 04 සහ 06 යන දෙදින තුළ සිදුකෙරිණ. 12 වන පාබල සේනාංක මූලස්ථාන බලප්‍රදේශයට අයත් 121 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීයූඑන් සේරසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් සහ මඟපෙන්වීම යටතේ සිදුකළ මෙම ප්‍රජාසත්කාරයට මොණරාගල දිස්ත්‍රික් අඩවි වන නිලධාරීන් 12 දෙනෙකු සමඟ යුද්ධ හමුදා නිලධාරීන්, සෙබළුන් පිරිසක් එකතු වූහ.


කපිතාන් එඩ්වඩ් හෙන්රි පේද්‍රිස් සිය අශ්වයා සමගින්

# සිය මරණය අභියස නොබියව මුහුණදුන් අභීත කපිතාන් එඩ්වඩ් හෙන්රි පේද්‍රිස්



සටහන
ලුතිනන් දුමින්ද සෙනරත්
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ලංකාවේ විසූ ප්‍රමුඛ පෙළේ සමාජ ක්‍රියාකාරිකයෙකු මෙන්ම, හමුදා නිලධාරියෙකු වූ කපිතාන් හෙන්රි පේද්‍රිස් වර්ෂ 1888 අගෝස්තු මස 16 වන දී මෙරට ජන්මලාභය ලැබීය. ඒ මෙරට මිනිරන් පතල්, වතුපිටි සහ තවත් වෙළෙඳ ව්‍යාපාර රැසක හිමිකරුවෙකු වූ දියෝනගේ දිසාන් පේද්‍රිස් මුදලිතුමන්ට සහ මලිනෝ ප්‍රනාන්දු පේද්‍රිස් මැතිනියට දාව, සහෝදරියන් සිව් දෙනෙකුගෙන් යුත් පවුලක බාලම පිරිමි දරුවා ලෙසිනි.

එඩ්වර්ඩ් හෙන්රි පේද්‍රිස් කුඩා අවධියේදී සිය ද්විතීයික අධ්‍යාපන කටයුතු වෙනුවෙන් කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුළත් වූ අතර, එහිදී ඔහු වඩාත් දක්ෂතාවයක් දැක්වූ ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රගුණ කිරීමට අවස්ථාවක් හිමි විය. පසුකලක ශාන්ත තෝමස් විද්‍යාලයටද ඇතුළත් වූ හෙතෙම දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙකු වශයෙන් සිය කුසලතාවයන් එහිදීද නැවතත් ප්‍රකට කරමින් කොළඹ රාජකීය විද්‍යාලයට යළි ඇතුළත්ව තව දුරටත් එම ක්‍රීඩාවේ නිරතව තිබිණි. එමෙන්ම එවක කොළඹ පැවති සියලුම සමිති සහ සමාගම්වල ක්‍රියාකාරී සාමාජිකයෙකුද වූ හෙතෙම මත්පැන් හෝ දුම්වැටි පානයෙන් තොර මහත්මා ගතිගුණවලින් හෙබි කඩවසම් හා ප්‍රිය මනාප පුද්ගලයෙකු විය.

තාරුණ්‍යයේ හිණිපෙත්තට එළැඹි කඩවසම් හෙන්රි පේද්‍රිස් යෞවනයා තමාගෙන් පසු තම වෙළෙඳ ව්‍යාපාර භාරගෙන ඒවා වැඩි දියුණු කරමින් කටයුතු කරනු දැකීම ඔහුගේ පියා වූ දිසාන් පේද්‍රිස් මුදලිතුමාගේ අභිප්‍රාය වුවද, එවකට ලොව පුරා පැතිර ගිය පළමු වන ලෝක යුද්ධයේ උණුසුමත් සමගින් එවකට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් මෙරට පිහිටුවන ලද නගර ආරක්ෂක බලකායට සම්බන්ධ වීමට ඔහු අවස්ථාව හිමිකර ගනු ලැබුවේ ඒ වෙනුවෙන් බ්‍රිතාන්‍ය නිලධාරීන් විසින් තෝරා ගන්නා ලද ප්‍රථම ස්වදේශික සිංහලයා වශයෙනි. තවද අශ්වයන් පිට යාම හා අශ්වයන් හැසිරවීම සම්බන්ධයෙන් ඔහු දක්වන ලද සුවිශේෂී දක්ෂතාවයන් හේතුවෙන් නොබෝ කලක් තුළදීම කොළඹ නගර ආරක්ෂක බලකායේ පරිපාලන අංශයේ කපිතාන් වරයෙකු ලෙස උසස් වීමක් ලැබීමට ද තරුණ එඩ්වඩ් හෙන්රි පේද්‍රිස් සමත් වී තිබිණි.

කෙසේ වුවද, මෙම ස්වදේශික හමුදා නිලධාරියා සතු සුවිශේෂී දක්ෂතාවයන් මෙන්ම, ඔහු මෙරට වංශවත් හා ධනවත් පවුල් පසුබිමකින් යුත් පුද්ගලයෙකු වීම හේතුවෙන් ඇතැම් බ්‍රිතාන්‍ය ජාතික නිලධාරීන්ගේ ඊර්ෂ්‍යාවට හෙතෙම ලක්වූ අතර, සිය පෞද්ගලික ධනයෙන් මිලදී ගන්නා ලද ඉතා අනර්ඝ හා මිල අධික අශ්වයෙකු පිට නැගී උදාර අයුරින් ගමන් ගන්නා මේ තරුණ හමුදා නිලධාරියා දෙස ඇතැම් නිලධාරීන් වපර ඇසින් බැලීමටද පටන් ගෙන තිබිණි.

එහි කූටප්‍රාප්තිය උදා වූයේ වර්ෂ 1915 මැයි මස 28 වන දින, කොළඹ ප්‍රදේශය ආශ්‍රිතව ඇති වූ සිංහල හා මුස්ලිම් කෝලාහලයක් මැඩ පැවැත්වීමට එහි ගිය තරුණ එඩ්වඩ් හෙන්රි පේද්‍රිස් අවාසනාවන්ත අයුරින් එම කෝලාහලයේම ගොදුරක් බවට පත් වීමත් සමගිනි. මේ පිළිබඳව ඉතිහාසයේ වාර්තා වන තොරතුරුවලට අනුව කොළඹ පිටකොටුව ප්‍රදේශය ආශ්‍රිතව ඇති වූ සිංහල හා මුස්ලිම් කෝලාහලයක් මැඩපැවැත්වීමට එහි යවන ලද තරුණ එඩ්වඩ් හෙන්රි පේද්‍රිස්ට එහි සිටි විරෝධතාකරුවන් විසුරුවා හැරීම වෙනුවෙන් සිය රාජකාරි පිස්තෝලයෙන් දෙවරක් අහසට වෙඩි තැබීමට සිදුව තිබේ. කෙසේ නමුත් මෙම වෙඩි තැබීම සිදුවීමත් සමඟම, එම සිංහල මුස්ලිම් කෝලාහලයට හෙන්රි පේද්‍රිස් ගේ සම්බන්ධයක්ද ඇති බව පවසමින් නිවැරදි නොවන අසත්‍ය තොරතුරු වාර්තා කිරීමට තරුණ එඩ්වඩ් හෙන්රි පේද්‍රිස්ට ඊර්ෂ්‍යා කළ ඇතැම් සුදු නිලධාරීන් කටයුතු කිරීම නිසාවෙන්, මෙම කෝලාහලය මෙහෙයවීම පසුපස හෙන්රි පේද්‍රිස් ගේ සම්බන්ධයක්ද ඇතැයි වරදවා වටහාගත් ඉංග්‍රීසි ආණ්ඩුව පැලියගොඩ සිට කොළඹ පිටකොටුව දක්වා විරෝධතා රැලියක් සූදානම් කර ඊට නායකත්වය දෙමින් පිටකොටුව ප්‍රදේශයේදී මුස්ලිම්වරුන්ට වෙඩි තැබුවේ යැයි ඔහුට විරුද්ධව චෝදනා ගොනු කොට අත්අඩංගුවට ගෙන තිබිණි .

කෙසේ වෙතත් එඩ්වඩ් හෙන්රි පේද්‍රිස් කපිතාන් වරයා අත්අඩංගුවට ගැනීමත් සමගින් එවකට බ්‍රිතාන්‍ය

අධිරාජ්‍යවාදීන්ගෙන් මෙරට නිදහස් කරගැනීම සඳහා නිදහස් සටනට නායකත්වය ලබා දුන් ස්වදේශිකයන් වන ඩී.එස් .සේනානායක, ඩී.ආර්. විජේවර්ධන, එෆ්.ආර්. ඩයස් බණ්ඩාරනායක, එච්.ඩබ්ලිව් අමරසූරිය, ඒ.එච්. මොලමුරේ, ඊ.ටී. ද සිල්වා, එඩ්වින් විජයරත්න, ආචාර්ය සී. පෙරේරා යනාදී ස්වදේශිකයන් රැසක් අත්අඩංගුවට ගැනීමට එවකට මෙරට පාලනය කළ බ්‍රිතාන්‍ය රජය විසින් කටයුතු කරනු ලැබුවේ රට පුරා කැරලි ඇතිවේ යැයි යන බිය පදනම් කරගනිමිනි. එමෙන්ම එවකට මෙරට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයාව සිටි සර් රොබට් චාමර්ස් විසින් ගෙන යන ලද අත්තනෝමතික ක්‍රියාවන් වල ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 1915 ජුනි මස දෙවන දින සිට රට පුරා මාෂල් නීතිය පැනවුණු අතර කැරලි කෝලාහලවලට සම්බන්ධ ඕනෑම පුද්ගලයෙකු වෙත තරාතිරමක් නොබලා වෙඩි තැබීමට යුද්ධ හමුදාව සහ පොලිසිය වෙත සම්පූර්ණ බලතල ලබාදී තිබිණි .

කෙසේ වුවද කපිතාන් හෙන්රි පේදිස්ට සිදුවූ මෙම ඉරණම සම්බන්ධයෙන් අතිශය සංවේගයට පත් ඔහුගේ ඥාති හිත මිතුරන් ඇතුළු තවත් ස්වදේශිකයන් ගණනාවක් විසින් හෙන්රි පේදිස් නිදහස් කරන ලෙසට ඉල්ලීමක් කරමින් එවකට මහා බ්‍රිතාන්‍යයේ රජු ලෙස ඔටුනු පළන් පස්වන ජෝර්ජ් රජු වෙත රිට් පෙත්සමක් මගින් අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. එසේ වුවත්, කපිතාන් හෙන්රි පේදිස් ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට කටයුතු කළ ශ්‍රීමත් හෙක්ටර් වැන් කුයිලන්බර්ග් විසින් ඉදිරිපත් කරන ලද තර්කයන් පිළිගැනීමට එවකට පැවැති ඉංග්‍රීසි ආණ්ඩුව මැලිවීම හේතුවෙන් යුද්ධ හමුදා නීතිය යටතේ ඔහු දැරූ සියලු නිලතලවලින් ඉවත් කර වර්ෂ 1915 ජූලි මස 07 වන දින වෙඩි තබා ඝාතනය කිරීමට එවකට පැවති බ්‍රිතාන්‍ය රජය විසින් නියෝගයක් ලබාදී තිබිණි .

ඒ අනුව වර්ෂ 1915, ජූලි මස 07 වන දින පංජාබ් සොල්දාදුවන්ගෙන් සමන්විත වෙඩි තැබීමේ හට කණ්ඩායමක් කපිතාන් එඩ්වඩ් හෙන්රි පේද්‍රිස්ට වෙඩි තබා ඝාතනය කරවීම සඳහා සූදානම් කරවන ලද අතර, ඔහුට වෙඩි තැබීමට මොහොතකට පෙර ඇස් බැඳීමට රෙදි පටියක් රැගෙන ආ අවස්ථාවේදී අභීත අයුරින් ඔහු පැවසූයේ "මගේ



කපිතාන් එඩ්වඩ් හෙන්රි පේද්‍රිස්ට මරණීය දණ්ඩනය ලබාදීමට මුල් වී කටයුතු කළ එවකට ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවර සර් රොබට් චාමර්ස්

**වර්ෂ 1915 ජූලි මස 07 වන දින පංජාබ් සොල්දාදුවන්ගෙන් සමන්විත වෙඩි තැබීමේ හට කණ්ඩායමක් කපිතාන් එඩ්වඩ් හෙන්රි පේද්‍රිස්ට වෙඩි තබා ඝාතනය කරවීම සඳහා සූදානම් කරවන ලද අතර, ඔහුට වෙඩි තැබීමට මොහොතකට පෙර දෑස් බැඳීමට රෙදි පටියක් රැගෙන ආ අවස්ථාවේදී අභීත අයුරින් ඔහු පැවසූයේ "මගේ ඇස් වහන්න අවශ්‍ය නෑ. උඹලගෙ ඔය සෙල්ලම බලන්න මටත් ආසයි" යනුවෙනි.**

ඇස් වහන්න අවශ්‍ය නෑ, උඹලගෙ ඔය සෙල්ලම බලන්න මටත් ආසයි" යනුවෙනි.

ඒ අනුව වර්ෂ 1915 ජූලි මස 7 වන දින පෙරවරුවේ වැලිකඩ බන්ධනාගාරය තුළදී කපිතාන් එඩ්වඩ් හෙන්රි පේද්‍රිස් වෙඩි තබා ඝාතනය කරන ලදී. අනතුරුව, වෙඩි තබන අවස්ථාවේ ඔහු හිඳගෙන සිටි ලෙයින් පෙඟවී ගිය ආසනය එවකට වැලිකඩ බන්ධනාගාරය තුළ රඳවා සිටි නිදහස් සටන මෙහෙයවන ලද අනෙකුත් ස්වදේශිකයන්ටද පෙන්වමින් "වැඩිය දැඟලුවොත් උඹලටත් වෙන්නේ මේ ටිකම තමයි" පවසා ඔවුන් බිය වැද්දීමටද බ්‍රිතාන්‍ය ජාතික සුදු නිලධාරීන් විසින් කටයුතු කරන ලදී.

එමෙන්ම කපිතාන් එඩ්වඩ් හෙන්රි පේද්‍රිස්ට වෙඩි තබා ඝාතනය කිරීමත් සමඟින් නිදහස පතා සිදුකරන ලද අරගලයන් තවදුරටත් මුවහත් වූ අතර, එය වඩාත් කූටප්‍රාප්තියට පත් වෙමින් රටපුරා නව නිදහසක අරුණළු ඉස්මතු විය. ඉන් ලැබූ පන්නරය ශ්‍රී ලංකාවට මහා බ්‍රිතාන්‍යයෙන් නිදහස ලබාගැනීම සඳහා වඩාත් ඉවහල් විය.

කපිතාන් එඩ්වඩ් හෙන්රි පේද්‍රිස්ව ඝාතනය කළ ජූලි මස 7 වන දින මහත් විනාශයන් එළඹෙන අවස්ථාවේදී යෙදෙන "ජූලි හතයි" යන සිංහල යෙදුම බිහි වීමටද බලපා තිබිණි.



කපිතාන් එඩ්වඩ් හෙන්රි පේද්‍රිස් ප්‍රිය සම්භාෂනයකදී ගත් ඡායාරූපයක්



බොරැල්ල සුසාන භූමියේ පිහිටා ඇති කපිතාන් හෙන්රි පේද්‍රිස්ගේ සොහොන් කොත




## ප්‍රේමයේ විරහව...

නිහඬ ගොළු රාත්‍රියේ
මැවුනු සන්තාපයක් දරා
උමතු හුදකලාව සමඟින්
ගෙවෙනා නිමේෂය පාළුයි...

සීතල සුළඟට හාදු තියා
මියදුණු ප්‍රේමයෙ විරහවට
ලියන්න කවියක් අකුරු කර
සුන්දර නෑ ගොළු වී රාත්‍රිය...

අසෙනි වැස්සක හිරිකඩේ
පාළුව ඉහ වහ ගිය ඇඳිරියේ
ආදරේ හිමිකම් නැති සුවේ
විඳින්නම් තනිකම පාළුවේ...

**සෙ/285101 ලා/කෝ ඒකනායක ඊඑම්ඩීඑ** - 563 වන පාබල බලසේනාව

## මහන දම...

සියල්ල අස්ථිර ලෝකයක
ස්ථිර වන්නට වෙර දරණ
කුරිරු මිනිසුන්ගෙන් වෙන්ව
වන ගතව
තවුස්දම් පුරමින්
සසර බව දුක් ගැහැට
නිවාලන්නට මඟ සොයන
මහන දම...

**සෙ/328402 ලා/කෝ චන්ද්‍රසේකර එල්එස්** - 12 ශ්‍රීලපාහ

ඔබ ඇතැම් පුද්ගලයන්ට
ඔබේ ජීවිතය තුළ
වැඩි වැදගත්කමක් දෙන විට
ඔවුන්ගේ ජීවිතය තුළ
ඔබට ඇති වටිනාකම
ක්‍රමයෙන් හීන් වෙයි...

**සෙ/242738 කෝප්‍රල් වැලිකලගේ ඩබ්ලිව්ඩීඩීයුකේ**
6 ශ්‍රීලංඉ

හිතන්නවත් හිතකුත් නෑ
ලබන්නට දේකුත් නෑ
හැම දේම සුන්වී ගියේ
හඬන්නවත් කඳුලක් නෑ
පතන්නම් පැතුමක් මා
මුළු ලෝකේම ඔබමයි වුණේ
මට නොදැනීම ඔබමයි වෙන් වූයේ

**සෙ/481282 කෝප්‍රල් චන්ද්‍රතිලක පීඒ** - 14 ගරෙ

කඳුළු පැන් කඳුළු පැන් කෙණ්ඩියක්
සිනහා මල් සිනහා මල් වට්ටියක්
දෝතට ගෙන යා හැකි දුර
ගව් සියයක්වත් වේ නම්
ප්‍රේමවන්තියක් උනාට කමක් නෑ
දුවේ...

**සෙ/369900 සැරයන් සිසිර කුමාර එස්කේජී** - 12 ශ්‍රීලංසිරෙ

හීන ඔයාගේ නම්...
උත්සාහය ඔයාගේ නම්...
මහන්සි නොබලා දුවන්න
වටේ ඉන්න අය අදාළම නැහැ...

**සෙ/376771 සැරයන් ජයවීර ආර්එල්පීපී** - 7 ශ්‍රීලංසිරෙ

ඔයා අඬද්දී
හිනා උනේ
ඔයා මේ ලෝකේ
එළිය දැක්ක දවසෙම විතරයි
ඔයාගේ ඔය ඇස්වල
කඳුළු මට දීලා
මගෙ සිනහවත් අරන්
හැමදාම හිනාවෙලා ඉන්න
රත්තරං දුවේ

**සෙ/420441 සැරයන් එදිරිසිංහ ඊඒඒඑන්** - 12 ගැහේබ

## පා ගමන් සමරමි...

හබරණ මහ කැලේ
පුලතිසියේ සුදු කන්ද
ගිරිතලේ අඩවියේ
මැදිරිගිරි මහ වනේ...
මාදුරුඔය රක්ෂිතේ
පුහුණු කෙරුමට සිසුන්
යුධ කැළෑවක් කොට
ඇවිද ගිය හැටි මැවේ...

තොප්පිගල මහ වනේ
දිඹුලාගල ගලේ
උන්නච්චි මහ වනේ
රකිම් වනාන්තරේ
වෙරළ මාතර කැලේ
අම්පාර මහ වනේ
වන්නියේ බියකරු වනේ...

උතුරේ මන්කුලු කැලේ
විල්පත්තු රක්ෂිතේ
පිදුරුතල ගිරි හිසේ
මේ හැම වංකගිරියක්ම...
සතුරන් සොයන්නට
මිතුරු සෙබළුන්
විරු නිල දරුවන් සමග
ඇවිද්දෙමි දින සති මාස ගණන්...

සිහල අප නිජ බිමේ
තියන හැම වනයකම
ඇවිද සිරි විඳින්නට
සමෙතකු වීමට පිනක්...
සිහිවන විටත් ඒ
බියකරු සොම් සඳක්
දිවා රෑ කරුවලේ
සක්මන් කළ හැටිත්...

මේ සොඳුරු විඳගැනුම
හරිම හරි විනෝදයි
බියකරුයි ප්‍රචණ්ඩයි
කෙසේ හෝ දිවි හිමිව
ඉසිඹුවක් ලබා අද
ඇවිද්දෙමි මනසින්
එදා ඒ වන ගමන්...

අනේ කොච්චර පිනක්
කරලා තියෙනවද මා
සොඳුරු වූ ඒ දසුන්
දිවි හිමිව දකින්නට...
මේ හැමම ඔබ නිසා
මව්නි හමුදාව යුධ
දොහොත් මුදුනත තබා
වඳිමි බැතියෙන් සදා

**මේජර් (උපා) ඩබ්ලිව්එම් ආරිවංශ යූඑස්පී (විශ්‍රාමික)** - ගරෙ

# බර බැලීම...

ජීවිත රක්‍ෂණයක් සඳහා ඉල්ලුම් පත්‍රයක් පුරවමින් සිටි රක්‍ෂණ නියෝජිතයා, සෙනෙවිරත්න මහත්මයාගෙන් ඔහුගේ බර කොපමණ දැයි ඇසීය.

"ඇස් කන්නාඩි කුට්ටමත් සමඟ රාත්තල් 160 යි"

සෙනෙවිරත්න මහතාගේ පිළිතුරෙන් විමතියට පත් නියෝජිතයා මෙසේ ඇසිය

"ඇයි මහත්තය ඉතිං කන්නාඩි කුට්ටම ගලවල තියල බර කිරුවෙ නැත්තෙ"

"එතකොට මට තරාදියෙ ඉලක්කම් පේන්නෙ නැහැ නොවැ"

# නෑම...

මගේ මිත්‍රයා විදේශීය සංචාරයක යෙදී සිටියදී එක්තරා හෝටලයක නවාතැන් ගැනීමට ගිය විට, එහි කාමර වෙන්කර දෙන්නා මෙසේ විමසීය.

මහත්තයට ඕනෑ කරන්නේ නාන්ඩ "වතුර මල තිබෙන නාන කාමරයක්ද, වතුර ටැංකියක බැහැල නාන්ඩ තිබෙන කාමරයක්ද?"

"ඇයි, මොකක්ද දෙකේ වෙනස...?"

"වතුර මල තිබෙන නාන කාමරයෙ හිටගෙනයි නාන්ඩ වෙන්නෙ"



# චරිත සහතිකය...

ගමට අලුතින් ග්‍රාමසේවක කෙනෙකු පත්විය. ඔහුගෙන් චරිත සහතික ලබාගැනීම ඉතා අසීරු විය. දිනක් ප්‍රදේශයේ මදාවියෙකු වූ අත කොට පියදාස චරිත සහතිකයක් ලබාගැනීමේ උවමනාවෙන් ග්‍රාමසේවක හමුවිය.

**ග්‍රාමසේවක** - (පියදාසව ගණන් නොගෙන) මීට කලින් මොකුත් වැරදි වැඩ එහෙම කරල තියෙනවද...?

**පියදාස** - මීට කලින් හිටපු ග්‍රාමසේවකගෙන් චරිත සහතිකයක් ඉල්ලල උඹ බෑ කිව්වම මම උගෙ දකුණු අතයි, දත් දෙකකුයි කැඩෙන්න ගැහුවා...

**ග්‍රාමසේවක** - ආ ඉඳගන්න... ඉඳගන්න... චරිත සහතික කීයක් ඕනද...?



# මටත් ආසයි...

විජේපාල හා සුමනා උද්‍යානයේ කොනකට වී පෙම්බස් දොඩමින් උන්නහ. ඔවුනට නුදුරින් බලු පැටියෙකු හා බැල්ලියක් මුහුණට මුහුණ තබා ඉවකරමින් සිටියේය. මෙය දුටු විජේපාලට අලුත් අදහසක් පහළ විය.

**විජේපාල** - සුමනෝ... දැක්කද අර බලු පැටියා බැල්ලිට කරන දේ... මටත් ආසයි පණේ එහෙම කරන්න...

**සුමනා** - ඉතිං...

**විජේපාල** - ඉතිං ඔයා ඒකට අකමැති නැහැ නේද...?

**සුමනා** - මළ කෝලං... මං මොකටද අකමැති වෙන්නෙ... ඒ බැල්ලි හරි හීලැයි...



# නාඩගම...

සෑහෙන කාලයකට ඉස්සර කැප්පෙටිපොල නාඩගම නටන්නට ගොස් සිදුවූ අපූරු සිදුවීමක් අපේ උපාලි අයියාගෙන් අසන්නට ලැබුණි. කථාවේ හැටියට කැප්පෙටිපොල නාඩගමේ එක්තරා අවස්ථාවකදී කැප්පෙටිපොල තුමා විසින් සුද්දෙකුට වෙඩි තබන දර්ශනයක් විය. සවුන්ඩ් ඉෆෙක්ට් නොතිබුණු ඒ කාලයේ වෙඩි තබන දර්ශනය සිදුකරන අවස්ථාවේදීම වෙඩි හඬ ඇසීම සඳහා රතිඤ්ඤා පත්තු කිරීමට සැලසුම් කොට තිබුණි.

ඔන්න ඉතිං දැන් වෙඩි තබන විටම රතිඤ්ඤය පත්තු කිරීමට සියල්ල සූදානම් කොට තිබුනා. කැප්පෙටිපොලට රඟපාන නළුවාද නියමිත වෙලාවටම වෙඩි තබන ආකාරයද දක්වන ලදී. අනේ වෙලාවටම රතිඤ්ඤා කරල පත්තු වුනේ නැත. ප්‍රේක්‍ෂකාගාරයෙන් දෙක තුන හූ හඬ ආරම්භ වන විටම සිදුවූ දෙය ප්‍රේක්‍ෂකයන්ට නොදැනෙන්නට කුමක් හෝ කොට වැඩේ ෂේප් කරගත යුතු නිසා නළුවාද මොලේ පාවිච්චි කොට පත්තු නොවූ තුවක්කුව දෙස තරහින් බලා එය පැත්තකට විසිකොට ඉනේ තිබූ පිහිය ගෙන සුද්දාට පිහියෙන් අනින්නට විය.

අනේ කරුමයක මහත. පිහියෙන් අනින විටම "ඩෝං" ගාමින් රතිඤ්ඤය පත්තු විය.

# ආපදා ස්ථාන නිරීක්ෂණය කරමින්



පැවති අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් 68 වන පාබල සේනාංකය යටතේ ඇති 682 වන පාබල බලසේනා මූලස්ථාන බලප්‍රදේශයෙහි ස්ථාපිත 6 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු ඒකක බලප්‍රදේශයෙහි ආනන්දපුරම් ග්‍රාමසේවා වසමෙහි ජලයෙන් යටවී තිබූ නිවාස 05 ක නිවැසියන් මුදවාගැනීමේ මෙහෙයුමක් එම ඒකකයේ භටපිරිස් විසින් ක්‍රියාත්මක කළහ. එම ආපදා සිදුවූ ස්ථාන නිරීක්ෂණය කිරීම සඳහා ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජ්එස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ඉකුත් නොවැම්බර් 25 වන දින නිරීක්ෂණ චාරිකාවක නිරත විය.

# මාහැඟි පූජා සත්කාරයක්





යුද්ධ හමුදා සංවත්සර දිනට සමගාමීව 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ උපදෙස් හා මගපෙන්වීම මත 522 වන පාබල බලසේනාව යටතේ රාජකාරී නියුතු 7(සේවා) ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් විසින් පසුගිය ඔක්තෝබර් 10 සහ 11 යන දෙදින තුළ වැඩසටහන් රැසක් සංවිධානය කරනු ලැබූහ. ඒ අනුව මිරුසුවිල් ශුද්ධ වූ පවුලේ ළමා නිවාසයේ සිසු දරුවන් ඇතුළු කාර්ය මණ්ඩලය වෙත දිවා ආහාරය ලබාදීම හා සිසුන් සඳහා අත්‍යවශ්‍ය පාසල් උපකරණ බෙදාදීමටද, කෙත්පේලි ග්‍රාමසේවා වසමේ පදිංචි තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා රුපියල් 1500.00 ක වටිනාකමක් සහිත වියළි සලාක ඇතුළත් ඇසුරුම් මළු පරිත්‍යාග කිරීමටද කටයුතු කෙරිණ.

# ඉගෙනුමට අත්වැලක්





8 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ බලඇණි දිනයට සමගාමීව ජපානයේ ටෝකියෝ වෙබ් පාසල සමඟ සම්බන්ධතාවයෙන් එම ඒකක බලප්‍රදේශයේ ස්ථාපිත ශ්‍රී බෝධිරාජ ළමා ගම්මානයේ සහ ශාන්ත ජෝන් ළමා නිවාසයේ ඉගෙනුම ලබන දූවා දරුවන් හට ලැප්ටොප් පරිගණක යන්ත්‍ර, මල්ටිමීඩියා හා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පසුගිය නොවැම්බර් 08 වන දින පැවැත්විණ. 611 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එල්ජේඑල්බී උඩෝවිට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, 8 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩීසීඑස්කේ අතුකෝරල ආර්එස්පී අතින් අදාළ පරිත්‍යාග බෙදාදීම සිදුකෙරිණ.

**වෘත්තීය දිවියේ අනේකවිද කඩඉම් පසුකොට**
**සුබ මොහොතින් නව තනතුරු ලැබූ ඔබ සියලු දෙනාට**
**දිරිය, විරිය, රැකවරණය ලැබේවායි**
**"රණවිරුවා" මෙසේ සුබ පැතුම් එක්කරයි.**



ආරක්ෂක සේනා (මුලතිව්)
ආඥාපති ලෙස
**මේජර් ජෙනරාල්**
**ඩබ්ලිව්ඩීඑස්එස් වනසිංහ ආර්එස්පී**
**යූඑස්පී එන්ඩියූ**
**2021 නොවැම්බර් මස 04 දින සිට**



විජයබාහු පාබල රෙජිමේන්තුවේ
රෙජිමේන්තු අධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**එස්යූඑම්එන් මානගේ**
**ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී පීඑස්සී**
**2021 නොවැම්බර් මස 05 දින සිට**



53 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**කේපීඑස්ඒ ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී එන්ඩියූ**
**2021 ඔක්තෝබර් මස 28 දින සිට**



51 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
**මේජර් ජෙනරාල්**
**එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී**
**වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**එන්ඩියූ පීඑස්සී**
**2021 ඔක්තෝබර් මස 27 දින සිට**



52 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
**බ්‍රිගේඩියර්**
**පීපීඑල්එස් වික්‍රමසේන ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
**එච්ඩීඑම්සී**
**2021 ඔක්තෝබර් මස 28 දින සිට**



සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ
අධ්‍යක්ෂ ලෙස
**බ්‍රිගේඩියර්**
**එච්ඩීඩබ්ලිව්කේඑන් ඊරියගම**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**
**2021 නොවැම්බර් මස 01 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(වන්නි) බ්‍රිගේඩියර් (පාලන/භකාස)
ලෙස
**බ්‍රිගේඩියර්**
**ඕඑම්ඩී ගුණසිංහ**
**2021 නොවැම්බර් මස 22 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(වන්නි) බ්‍රිගේඩියර් ප්‍රධාන
මාණ්ඩලික නිලධාරී ලෙස
**බ්‍රිගේඩියර්**
**ඩීඑන්ජේ ප්‍රනාන්දු ආර්එස්පී යූඑස්පී**
**2021 නොවැම්බර් මස 17 දින සිට**



512 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස
**බ්‍රිගේඩියර්**
**ටීසීඑම්පීඑස්ටී කුරේ ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
**2021 ඔක්තෝබර් මස 29 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(යාපනය) කර්නල් සම්බන්ධීකරණ
නිලධාරී ලෙස
**කර්නල්**
**එච්කේජේයූ ජයරත්න**
**2021 නොවැම්බර් මස 13 දින සිට**



යුහ නිවාරණ වෛද්‍ය හා මානසික
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ
අධ්‍යක්ෂ ලෙස
**කර්නල්**
**ඩීකේඑස්එස් දොඩම්ගොඩ**
**ආර්එස්පී යූඑස්පී**
**2021 නොවැම්බර් මස 18 දින සිට**



1 වන යුද්ධ හමුදා බලකායේ මව්මෙ
අංශයේ ප්‍රමානි 1 (මව්මෙ) ලෙස
**ලුතිනන් කර්නල්**
**පීඑල් කිත්සිරි**
**2021 නොවැම්බර් මස 01 දින සිට**

# ENGLISH Vision...

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Let’s not

අපි නොකර ඉඳිමු යන අර්ථය සහිතව යමක් පිළිබඳව ප්‍රකාශ කිරීම සඳහා මෙම වාක්‍යය රටාව භාවිතා කළ හැක.

***Fomular*** :- සූත්‍රය

**Let’s not + Objective Pronoun + Verb (Infinitive) + Object + Rest.**
ලෙට්ස් නොට් + ඔබ්ජෙක්ටිව් ප්‍රෝනවුන් + වර්බ් (ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
නොකරඉමු + කර්ම කාරක සර්වනාම පදය + ක්‍රියා පදයේ මූල ස්වරූපය + කර්මය ඉතිරිය.

***Ex*** / *උදා* :-

1. Let's not discuss about that now.
   ලෙට්ස් නොට් ඩිස්කස් "අබවුට් දැට් නව්"
   අපි ඒ ගැන දැන් කතා නොකර ඉඳිමු.

2. Let's not stay here too long.
   ලෙට්ස් නොට් ස්ටේ හියර් ටූ ලෝන්ග්
   අපි මෙතන වැඩිවෙලා නතර නොවී ඉඳිමු.

3. Let's not stop anywhere on the way.
   ලෙට්ස් නොට් ස්ටොප් එනිවෙයාර් ඔන් ද වේ.
   අපි යන අතරමග කිසි තැනක නතර නොවී ඉඳිමු.

4. Let us not worry too much.
   ලෙට්ස් නොට් වොරි ටූ මච්.
   දැන් අපි දුක් නොවී ඉඳිමු.

***Nota Bene*** / සැ.යු :-

ඉහත පෙන්වා දී ඇති ආකාරයට අනුව යම් ආරාධනාවක් නැත යන අර්ථයෙන් සිදුකිරීමේදී මෙම වාක්‍යය රටාව භාවිතා වේ. එහිදී, us - අපි යන අර්ථය සමග "Let" යන පදය සංයෝගවී Let’s වශයෙන් භාවිතාවීම පමණක් වාක්‍යවල දැකිය හැක. එහිදී not යන පදයේ අර්ථය නැත යන අර්ථය ගැනීම සඳහා යෙදේ.

- ***Let not:-*** "නොකර ඉඳිමු" ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම ඛණ්ඩය වාක්‍යයේ භාවිතා වේ.

- ***Objective Pronoun :-*** කර්ම කාරක සර්වනාම පද වශයෙන් පහත පෙන්වාදී ඇති පද භාවිතා වේ. me – මට, us –අපට, them – ඔවුන්ට, her –ඇයට, him – ඔහුට, it - ඌට තවද නිදසුන්හි පෙන්වාදී ඇති පරිදි මෙහිදී පුද්ගලයෙකුගේ නමක් වුවද භාවිතා කළ හැක.

- ***Verb :-*** ක්‍රියා පදය වාක්‍යයේ භාවිතා කිරීමේදී ක්‍රියා මූල Infinitive පදයක් ලෙස භාවිතා කළ යුතුය.

- ***Rest :-*** ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

**Analysis of the sentence formation** - වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය.

**Let’s not + Objective Pronoun + Verb (Infinitive) + Object + Rest.**
ලෙට්ස් නොට්+ඔබ්ජෙක්ටිව් ප්‍රෝනවුන්+වර්බ් (ඉන්ෆිනිටිව්) +ඔබ්ජෙක්ට්+රෙස්ට්.
නොකරඉමු + කර්ම කාරක සර්වනාම පදය + ක්‍රියා පදයේ මූල ස්වරූපය+ කර්මය ඉතිරිය.

**Let's not stay here too long.**
ලෙට්ස් නොට් ස්ටේ හියර් ටු ලෝන්ග්
අපි මෙතන වැඩිවෙලා නතර නොවී ඉඳිමු.

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමග එක්වන්න. තවද ඔබට මග හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.




**කපිතාන් චමින්ද ලියනගේ**
**ශ්‍රීලයුපොදුසේබ**
**ජනමාධ්‍ය අම - යුහමු**
**www.englishvision.lk**

# සංචාරයක සටහන්





විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සිය ධුරයේ රාජකාරී ආරම්භ කිරීමෙන් පසු ඉකුත් නොවැම්බර් 16 වන දින පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හා ඒ යටතේ පාලනය වන රණවිරු සම්පත් කේන්ද්‍රය, රණවිරු සෙවණ හා මිහිඳු සෙත් මැදුර වෙත නිල සංචාරයක් සිදුකරන ලදී.

එහිදී පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් අයිඑච්එම්ටීඑච් සේනාරත්න යූඑස්පී විසින් එම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් හා කාර්යභාරය පිළිබඳ සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක්ද සිදුකරන ලදී. සිය සංචාරයේදී විධායක ජෙනරාල් විසින් රණවිරු සෙවණ හා මිහිඳු සෙත් මැදුර සුවසහන නිකේතනයන්හි නේවාසිකව ප්‍රතිකාර ලබන රණශූරයින්ගේ සුවදුක් විමසා බැලීමටද අමතක නොකළේය. මෙම අවස්ථාව සඳහා රණවිරු සෙවණ, රණවිරු සම්පත් කේන්ද්‍රය හා මිහිඳු සෙත් මැදුරෙහි සේනාවිධායකවරුද සහභාගී වූහ.

---


රණවිරුවා



පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම
සෙ/752158 බනි II සේනාරත්න ජීසී
3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ
එම්ජීජ්එම් 11 ඉසේරෙ
සෙ/754676 ලාන්ස් කෝප්‍රල්
ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ



අධීක්ෂණය

බ්‍රිගේඩියර්
එච්ඩබ්ලිව්එල්පී අමරපාල
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී



උපදේශකත්වය

ලුතිනන් කර්නල් ඩීඑම්එම් දිසානායක
ආර්ඩබ්ලිව්පී



ප්‍රධාන සංස්කාරක

ලුතිනන් කර්නල්
ඊඒඒ සුජිත් චමින්ද



රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ
මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

ඊමේල්

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන

011 2993076

යුහ දිගුව

51445/51446



ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලය

# භටකාර්ය සම්පාදන විද්‍යාලයේ පාඨමාලා අංක - 07 විසිරයයි



පුරා වසරක කාලයක් ත්‍රිකුණාමලය භටකාර්ය සම්පාදන විද්‍යාලයේ (*ASL*) දී පැවති භටකාර්ය සම්පාදන මාණ්ඩලික නිලධාරි පාඨමාලා අංක - 07 සාර්ථකව හැදෑරූ හමුදා නිලධාරීන් 26 දෙනෙකු ඉකුත් නොවැම්බර් 27 වන දින ත්‍රිකුණාමලයේ නාවික හමුදා විද්‍යාපීඨයේදී පැවති හමුදා සම්ප්‍රදායානුකූල උත්සවයකදී විසිර ගියහ. එම පිරිසට නේපාලයේ සහ බංගලාදේශයේ හමුදා නිලධාරීන් දෙදෙනෙකු, නාවික හමුදා නිලධාරීන් දෙදෙනෙකු, ගුවන් හමුදා නිලධාරියෙකුද ඇතුළත් විය.

උපාධි ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහභාගී වූ අතර, එහිදී එතුමන්ගේ සුරතින් උපාධිධාරීන් වෙත උපාධි සහතිකපත් සහ ඇගයීම් සහතිකපත් ප්‍රදානය කෙරිණ. එම අවස්ථාව සඳහා ආරාධිත අමුත්තන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ එම විද්‍යාලයේ මාණ්ඩලික නිලධාරීන් පිරිසක්ද එක්වූහ.









## සඳ හිරු සෑ රදුන්..

සිඳ සිඳ දුරැර අණ වින සතුරු ලක්තලේ
බිඳ බිඳ සෙමින් දහඩිය කඳුළු එක්කළේ
සඳ හිරු පවා නමදින රැයේ දහවලේ
සඳ හිරු සෑය රජරට අහස් කුස දිලේ

නොබෙදුණු බිමක පියවර තබා යන මගේ
පිබිදෙන දැයක් අත්වැල් බඳින හැටි අගේ
ලැබදෙන සැමට සුව සැනසිල්ල එක වගේ
හැබැහින් දකින විරු හිත්වලට තුටු නැගේ

ලුතිනන් කර්නල් ටීඑච් සුජිත් චමින්ද



